# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2014

# ඇගයීම් වාර්තාව

# 33 - ගිණුම්කරණය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014

## ඇගයීම් වාර්තාව

# 33 - ගිණුම්කරණය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ගිණුම්කරණය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස
පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ
ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2014 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 207304ක් පාසල් අයදුම්කරුවෝ ද 40072ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ගිණුම්කරණය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ගිණුම්කරණය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2014 විභාගයේ ගිණුම්කරණය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 දෙසැම්බර් 01

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | බුද්ධිකා පෙරේරා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන)<br><br>ආචාර්ය ඩබ්.වී.ඒ.ඩී. කරුණාරත්න<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>රංගජීව හේරත්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගණකාධිකරණ අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | චන්ද්‍රානි රූපසිංහ<br>රාජසිංහ මධ්‍ය විද්‍යාලය, හංවැල්ල.<br><br>ඩබ්ලිව්.ඇම්.ප්‍රේමනී ප්‍රනාන්දු<br>සාන්ත පීතර විදුහල<br>කොළඹ 04<br><br>බී.එම්. හතරසිංහ<br>විශාඛා උසස් බාලිකා විද්‍යාලය, බදුල්ල.<br><br>ඊ.එම්. නවරත්න<br>කුලි/කුලියාපිටිය මධ්‍ය විද්‍යාලය, කුලියාපිටිය. |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර<br>දත්ත සටහන් ක්‍රියාකරු II |
| **පිටකවරය සැකසුම** | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1 විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

## II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 8
2.1.2. I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න 9
2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14
2.1.4. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21
2.1.6. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය ප්‍රතිශත ලෙස 22
2.1.7. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය ප්‍රතිශත ලෙස 25

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 27
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, නිරීක්ෂණ, නිගමන හා යෝජනා 28
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 60

## III කොටස

3 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 61
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 62

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 ගිණුම්කරණය විෂයයෙහි අභිමතාර්ථ

මෙම විෂය හැදෑරීමෙන් ශිෂ්‍යයා,

* ගිණුම්කරණ සංකල්පීය රාමුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.
* ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ලබාගත් මූලික දැනුම භාවිතයට ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘතව ඇති නව්‍යතා අවබෝධ කර ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා වූ දැනුම විවිධ වෘත්තීය අවශ්‍යතා සඳහා භාවිතයට ගනියි.
* සමාජ ආර්ථික පරිසරයකට ඵලදායි ලෙස කටයුතු කළ හැකි කළමනාකරණ කුසලතා ලබා ගනියි.
* විවිධ ව්‍යාපාර සංවිධානවල ගිණුම් තැබීම පිළිබඳ කුසලතා ලබා ගනියි.
* විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලැබෙන හුරුව අනාගත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායක කර ගනියි.
* සම්පත් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා වර්ධනය කර ගනියි.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 49372 | 4024 | 53396 |
| දෙමළ | 8238 | 936 | 9174 |
| ඉංග්‍රීසි | 1710 | 623 | 2333 |
| **එකතුව** | **59320** | **5583** | **64903** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 5748 | 9.69 | 309 | 5.53 | 6057 | 9.33 |
| B | 5616 | 9.47 | 363 | 6.50 | 5979 | 9.21 |
| C | 11372 | 19.17 | 731 | 13.09 | 12103 | 18.65 |
| S | 16949 | 28.57 | 1242 | 22.25 | 18191 | 28.03 |
| F | 19635 | 33.10 | 2938 | 52.62 | 22573 | 34.78 |
| එකතුව | **59320** | **100.00** | **5583** | **100.00** | **64903** | **100.00** |

වගුව 2

විභාගයට පෙනී සිටි පාසල් අයදුම්කරුවන්ගෙන් 67%ක් පමණ ගිණුම්කරණය විෂය සමත් වුවද පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් මෙම විෂය සමත්ව ඇත්තේ 47%ක් පමණක් බව ඉහත සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වේ. සමස්ථයක් ලෙස අයදුම්කරුවන්ගෙන් 65%ක් පමණ ගිණුම්කරණ විෂය සමත් වී ඇත.

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 8292 | 1095 | 13.21 | 861 | 10.38 | 1758 | 21.20 | 2271 | 27.39 | 5985 | 72.18 | 2307 | 27.82 |
| 2. ගම්පහ | 5208 | 510 | 9.79 | 449 | 8.62 | 950 | 18.24 | 1431 | 27.48 | 3340 | 64.13 | 1868 | 35.87 |
| 3. කළුතර | 2482 | 300 | 12.09 | 237 | 9.55 | 455 | 18.33 | 665 | 26.79 | 1657 | 66.76 | 825 | 33.24 |
| 4. මහනුවර | 2752 | 208 | 7.56 | 213 | 7.74 | 532 | 19.33 | 831 | 30.20 | 1784 | 64.83 | 968 | 35.17 |
| 5. මාතලේ | 756 | 49 | 6.48 | 66 | 8.73 | 150 | 19.84 | 242 | 32.01 | 507 | 67.06 | 249 | 32.94 |
| 6. නුවරඑළිය | 1074 | 74 | 6.89 | 100 | 9.31 | 194 | 18.06 | 287 | 26.72 | 655 | 60.99 | 419 | 39.01 |
| 7. ගාල්ල | 2391 | 307 | 12.84 | 212 | 8.87 | 439 | 18.36 | 622 | 26.01 | 1580 | 66.08 | 811 | 33.92 |
| 8. මාතර | 1613 | 167 | 10.35 | 170 | 10.54 | 312 | 19.34 | 492 | 30.50 | 1141 | 70.74 | 472 | 29.26 |
| 9. හම්බන්තොට | 959 | 67 | 6.99 | 89 | 9.28 | 159 | 16.58 | 301 | 31.39 | 616 | 64.23 | 343 | 35.77 |
| 10. යාපනය | 1239 | 101 | 8.15 | 127 | 10.25 | 247 | 19.94 | 342 | 27.60 | 817 | 65.94 | 422 | 34.06 |
| 11. කිලිනොච්චි | 170 | 13 | 7.65 | 17 | 10.00 | 43 | 25.29 | 52 | 30.59 | 125 | 73.53 | 45 | 26.47 |
| 12. මන්නාරම | 212 | 11 | 5.19 | 18 | 8.49 | 34 | 16.04 | 65 | 30.66 | 128 | 60.38 | 84 | 39.62 |
| 13. වව්නියාව | 300 | 36 | 12.00 | 35 | 11.67 | 48 | 16.00 | 69 | 23.00 | 188 | 62.67 | 112 | 37.33 |
| 14. මුලතිව් | 155 | 6 | 3.87 | 18 | 11.61 | 30 | 19.35 | 42 | 27.10 | 96 | 61.94 | 59 | 38.06 |
| 15. මඩකලපුව | 728 | 86 | 11.81 | 105 | 14.42 | 170 | 23.35 | 209 | 28.71 | 570 | 78.30 | 158 | 21.70 |
| 16. අම්පාර | 969 | 83 | 8.57 | 100 | 10.32 | 204 | 21.05 | 310 | 31.99 | 697 | 71.93 | 272 | 28.07 |
| 17. ත්‍රිකුණාමලය | 558 | 48 | 8.60 | 41 | 7.35 | 106 | 19.00 | 157 | 28.14 | 352 | 63.08 | 206 | 36.92 |
| 18. කුරුණෑගල | 2524 | 200 | 7.92 | 183 | 7.25 | 459 | 18.19 | 756 | 29.95 | 1598 | 63.31 | 926 | 36.69 |
| 19. පුත්තලම | 1326 | 133 | 10.03 | 126 | 9.50 | 251 | 18.93 | 389 | 29.34 | 899 | 67.80 | 427 | 32.20 |
| 20. අනුරාධපුරය | 1157 | 87 | 7.52 | 79 | 6.83 | 226 | 19.53 | 335 | 28.95 | 727 | 62.83 | 430 | 37.17 |
| 21. පොළොන්නරුව | 581 | 51 | 8.78 | 28 | 4.82 | 110 | 18.93 | 178 | 30.64 | 367 | 63.17 | 214 | 36.83 |
| 22. බදුල්ල | 1409 | 98 | 6.96 | 73 | 5.18 | 241 | 17.10 | 386 | 27.40 | 798 | 56.64 | 611 | 43.36 |
| 23. මොනරාගල | 614 | 46 | 7.49 | 41 | 6.68 | 141 | 22.96 | 179 | 29.15 | 407 | 66.29 | 207 | 33.71 |
| 24. රත්නපුරය | 1986 | 270 | 13.60 | 220 | 11.08 | 390 | 19.64 | 515 | 25.93 | 1395 | 70.24 | 591 | 29.76 |
| 25. කෑගල්ල | 1266 | 143 | 11.30 | 119 | 9.40 | 252 | 19.91 | 337 | 26.62 | 851 | 67.22 | 415 | 32.78 |
| **සමස්ත දිවයින** | **40721** | **4189** | **10.29** | **3727** | **9.15** | **7901** | **19.40** | **11463** | **28.15** | **27280** | **66.99** | **13441** | **33.01** |

වගුව 3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 284 | 0.44 | 64903 | 100.00 |
| 81 - 90 | 2358 | 3.63 | 64619 | 99.56 |
| 71 - 80 | 4907 | 7.56 | 62261 | 95.93 |
| 61 - 70 | 6723 | 10.36 | 57354 | 88.37 |
| 51 - 60 | 8692 | 13.39 | 50631 | 78.01 |
| 41 - 50 | 11140 | 17.16 | 41939 | 64.62 |
| 31 - 40 | 12769 | 19.67 | 30799 | 47.45 |
| 21 - 30 | 11348 | 17.48 | 18030 | 27.78 |
| 11 - 20 | 6010 | 9.26 | 6682 | 10.30 |
| 01 - 10 | 663 | 1.02 | 672 | 1.04 |
| 00 - 00 | 9 | 0.01 | 9 | 0.01 |

වගුව 4

මෙම විෂය සඳහා අපේක්ෂකයින් ලකුණු ලබාගත් ආකාරය පන්ති ප්‍රාන්තර අනුව ඉහත වගුවේ දැක්වේ. උදාහරණ වශයෙන් ගතහොත් ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 64903 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 12769 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.67%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 30799ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 47.45%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

අයදුම්කරුවන් විසින් පළමු ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි ව පිළිතුරු සැපයූ ප්‍රතිශතය ඉහත ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ. නිදසුනක් ලෙස : ඉහත ප්‍රස්තාරය අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 01 වන ප්‍රශ්නයට වන අතර, එහි ප්‍රතිශතය 90%කි. අඩුම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 07 වන හා 42 වන ප්‍රශ්නවලටය. එහි ප්‍රතිශතය 12%කි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරය මගින් II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය තෝරා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. ඒ අනුව පෙනී යන්නේ අනිවාර්ය ප්‍රශ්න වන 1 සහ 2 ප්‍රශ්න සඳහා ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් සියලුම අයදුම්කරුවන් පිළිතුරු සපයා ඇති බවයි. සෙසු ප්‍රශ්නවලින් අයදුම්කරුවන් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ 3 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රමාණය 93%ක් පමණ වේ. සෙසු ප්‍රශ්න අතුරින් අයදුම්කරුවන් විසින් අඩුවෙන්ම තෝරා ගනු ලැබ ඇත්තේ 07 වන ප්‍රශ්නය වන අතර එය 53%කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරය මගින් II වන ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. නිදසුනක් ලෙස මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. එම ලකුණුවලින් 76%-100% (ලකුණු 16-20) ප්‍රාන්තරයේ ලකුණු ලබාගත් ප්‍රතිශතය 8%ක් පමණි. නමුත් අයදුම්කරුවන්ගෙන් වැඩිම පිරිස එනම් 39%ක්ම මෙම ප්‍රශ්නය සඳහා ලබාගෙන ඇත්තේ 0%-25% (ලකුණු 0-5) ප්‍රාන්තරයට අයත් ලකුණු ප්‍රමාණයයි.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4.  **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**




**ප්‍රස්තාරය 4** (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

# II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* කාලය පැය 02 යි.
* බහුවරණ ප්‍රශ්න 30ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කි.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
* පිළිතුරු පත් ඇගයීමේදී සෑම ප්‍රශ්නයකට ම ලකුණු 4 බැගින් ලබා දේ. ඒ අනුව මුළු ලකුණු 200 කි.
* අවසාන ලකුණු ගණනය කරන ආකාරය පිළිබඳව 25 පිටුවේ ඇතුළත් වේ.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ කාර්යභාරය **වඩාත්** හොඳින් විස්තර කරනු ලබයි ද?
(1) එය ආයතනයේ ගනුදෙනු සහ සිද්ධි මූල්‍ය පදනම මත මනිනු ලබයි.
(2) එය ආයතනයේ මූල්‍ය තොරතුරු එහි කළමනාකරුවන්ගේ භාවිතය සඳහා විශ්ලේෂණය කරනු ලබයි.
(3) එය ආයතනයේ ගනුදෙනු සහ සිද්ධි ගිණුම් පොත්වල වාර්තා කරනු ලබයි.
(4) එය ආයතනයේ තොරතුරු එය පිළිබඳ ව ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සපයනු ලබයි.
(5) එය ආයතනයේ සම්පත් භාවිත කිරීම පිළිබඳ තොරතුරු එහි කළමනාකරුවන්ට සපයනු ලබයි. (......)

**2.** ව්‍යාපාරයක ණයහිමියකුට ගෙවිය යුතු රු. 100 000 ක ශේෂයක් එහි අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් පියවන ලද පියවන අවස්ථාවේ දී, ණයහිමියා විසින් රු. 10 000 ක වට්ටමක් දෙන ලදී. මෙම ගනුදෙනුව, වගකීම් සහ හිමිකමට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි දක්වනුයේ,

| | **වගකීම්** | **හිමිකම** |
|---|---|---|
| (1) | රු. 90 000 කින් අඩු වේ. | රු. 90 000 කින් අඩු වේ. |
| (2) | රු. 90 000 කින් අඩු වේ. | රු. 90 000 කින් වැඩි වේ. |
| (3) | රු. 100 000 කින් අඩු වේ. | රු. 100 000 කින් අඩු වේ. |
| (4) | රු. 100 000 කින් අඩු වේ. | රු. 100 000 කින් වැඩි වේ. |
| (5) | රු. 110 000 කින් අඩු වේ. | රු. 110 000 කින් වැඩි වේ. |

(......)

**3.** පහත කාර්යයන් ගිණුම්කරණ ක්‍රියාවලියේ සිදුවන **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?
A - ගනුදෙනුව අදාළ මූලික පොතෙහි සටහන් කිරීම.
B - ව්‍යාපාර ගනුදෙනුව සිදුවීම.
C - ගනුදෙනුව සඳහා මූලික ලියවිල්ල පිළියෙල කිරීම.
D - ගනුදෙනුව ලෙජරයට පිටපත් කිරීම.
(1) B, A, C, D (2) B, C, A, D (3) B, C, D, A (4) C, B, A, D (5) C, B, D, A (......)

**4.** සපත්තු නිෂ්පාදනය කරන ව්‍යාපාරයක පහත ගනුදෙනු සටහන් කිරීමට මූලික පොත් භාවිත කෙරෙන අනුපිළිවෙළ වන්නේ,
A - ලොරියක් ණයට මිල දී ගැනීම.
B - සම් ණයට මිල දී ගැනීම.
C - වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම.
D - මිල දී ගත් සම්වලින් කොටසක්, සැපයුම්කරු වෙත නැවත යැවීම.
(1) පොදු ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, ගැනුම් ජර්නලය
(2) පොදු ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, ආපසු යැවුම් ජර්නලය
(3) පොදු ජර්නලය, ගැනුම් ජර්නලය, මුදල් පොත, ආපසු යැවුම් ජර්නලය
(4) ගැනුම් ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, ගැනුම් ජර්නලය
(5) ගැනුම් ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, ආපසු යැවුම් ජර්නලය (......)

**5.** මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් සහ ණයහිමියන් හඳුනාගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද
(1) උපචිත (2) ඒකක (3) කාලච්ඡේද (4) ගැළපුම් (5) උපලබ්ධි (......)

**6.** වත්කම් හා වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) උපචිත (2) සංගතතාව (3) අඛණ්ඩ පැවැත්ම (4) කාලච්ඡේද (5) උපලබ්ධි (......)

**7.** මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත කුමන දැ වත්කමක ලක්ෂණ වන්නේ ද?
A - එය ආයතනයක් විසින් පාලනය කළ හැකි සම්පතකි.
B - එය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරයි.
C - එහි පිරිවැය හෝ අගය විශ්වාසනීය ලෙස මැනිය හැකි වේ.
(1) B පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම. (......)

**8.** 2014.03.31 දිනට සීමිත රොෂාන් පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමක මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයක දී පහත දෑ හෙළිදරව් විය:

- වැටුප් සඳහා ගෙවූ රු. 100 000 ක් මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.
- ණයහිමියකුට ගෙවන ලද රු. 25 000 ක් ණයගැති පාලන ගිණුමේ මුදල් ලැබීම් ලෙස සටහන් කර තිබුණි.
- විකුණුම් ජර්නලය රු. 30 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
- බොල් ණය කපා හැරීම් රු. 20 000 ක් ආදායමක් ලෙස සටහන් කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය:
(1) රු. 145 000 හර. (2) රු. 145 000 බැර. (3) රු. 190 000 හර.
(4) රු. 190 000 බැර. (5) රු. 220 000 බැර. (......)

**9.** 2014.03.31 දිනට සීමිත අමා පොදු සමාගමේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 460 000 ක් වූ අතර එදිනට ණයගැති ලෙජරයේ, ණයගැති ශේෂවල එකතුව රු. 450 000 ක් විය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:

- රු. 10 000 ක ණයගැති ශේෂයක් බොල් ණය ලෙස කපා හැරීම ණයගැති පාලන ගිණුමේ පිටපත් කර නොතිබුණි.
- රු. 21 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 12 000 ක් ලෙස විකුණුම් ජර්නලයේ සටහන් වී තිබුණි.
- ණයගැතියකු විසින් සෘජුව ම බැංකුවට ප්‍රේෂණය කරන ලද රු. 31 000 ක් ණයගැති ලෙජරයේ සහ ණයගැති පාලන ගිණුමේ සටහන් වී නොතිබුණි.

2014.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ නිවැරදි ශේෂය:

(1) රු. 410 000 (2) රු. 428 000 (3) රු. 448 000 (4) රු. 459 000 (5) රු. 490 000 (……)

**10.** පහත තොරතුරු 2014 අප්‍රේල් මාසය සඳහා සමාගමකට අදාළ වේ.

| ගැනුම් | ලකුණු කළ මිල (රු.) | වෙළෙඳ වට්ටම් (%) | මුදල් වට්ටම් (%) |
|---|---|---|---|
| ණයට | 400 000 | 5 | 5 |
| මුදලට | 200 000 | 10 | - |

මිලදී ගත් දින සිට දින 15 ක් ඇතුළත ගෙවිය යුතු මුදල පියවුවහොත් පමණක් සැපයුම්කරුවන් විසින් මුදල් වට්ටම දෙනු ලැබේ. මෙම කාලය තුළ සමාගමට පියවීමට හැකි වූයේ ගෙවිය යුතු මුදලින් 50% ක් පමණි.

2014 අප්‍රේල් මාසය සඳහා සමාගම ලද වට්ටම් සටහන් කිරීමට අදාළ ජර්නල් සටහනෙහි නිවැරදි වටිනාකම්:

| | ණයහිමි පාලන ගිණුම හර (රු.) | ලද වට්ටම් ගිණුම බැර (රු.) |
|---|---|---|
| (1) | 9 500 | 9 500 |
| (2) | 10 000 | 10 000 |
| (3) | 29 500 | 29 500 |
| (4) | 30 000 | 30 000 |
| (5) | 39 500 | 39 500 |

(……)

**11.** පහත තොරතුරු 2014 මාර්තු මාසය සඳහා සමාගමක භාණ්ඩයකට අදාළ වේ.

| දිනය | විස්තරය | ඒකක ගණන | ඒකක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 2014.03.01 | තොගය | 3 000 | 80 |
| 2014.03.10 | ගැනුම් | 5 000 | 90 |
| 2014.03.15 | ආපසු යැවුම් (2014.03.10 දින මිලදී ගත් භාණ්ඩවලින්) | 1 000 | ? |
| 2014.03.20 | ගැනුම් | 3 000 | 70 |
| 2014.03.22 | විකුණුම් | ? | ? |
| 2014.03.31 | තොගය | 4 000 | ? |

තොග නිකුත් කිරීම, මිල කිරීම සඳහා සමාගම 'පෙර - පිවිසි පෙර - පිට' (FIFO) ක්‍රමය භාවිත කරයි.

2014.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය සහ 2014.03.31 දිනට තොගයේ වටිනාකම:

| | විකුණුම් පිරිවැය (රු.) | තොගය (රු.) |
|---|---|---|
| (1) | 420 000 | 300 000 |
| (2) | 480 000 | 330 000 |
| (3) | 480 000 | 320 000 |
| (4) | 510 000 | 300 000 |
| (5) | 540 000 | 360 000 |

(……)

**12.** එකතු කිරීමේ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමක් විසින් 2014.03.01 දින අත්පත් කරගත් යන්ත්‍රයක් හා පහත තොරතුරු බැඳේ.

| | රු. |
|---|---|
| යන්ත්‍රයේ ලැයිස්තුගත මිල | 800 000 |
| ගෙවූ VAT බදු | 86 400 |
| ප්‍රවාහන පිරිවැය | 30 000 |
| වැඩබිම සකස් කිරීමේ පිරිවැය | 20 000 |
| සවිකිරීමේ පිරිවැය | 40 000 |
| මූලික පරීක්ෂණ පිරිවැය | 50 000 |

අත්පත් කර ගන්නා අවස්ථාවේ දී 10% ක වෙළෙඳ වට්ටමක් ලැබුණි. මූලික පරීක්ෂණයේ දී නිෂ්පාදනය කරන ලද ඒකක 100 ක්, ඒකකයක් රු. 300 බැගින් විකුණන ලදි.

LKAS 16 ට (දේපළ, පිරියත සහ උපකරණ) අනුව මූලික හඳුනාගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය:

(1) රු. 830 000 (2) රු. 860 000 (3) රු. 896 400 (4) රු. 910 000 (5) රු. 916 400 (……)

**13.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයට අනුව ව්‍යාපාරයක දළ ලාභය සහ ශුද්ධ ලාභය අනුපිළිවෙළින් රු. 840 000 ක් සහ රු. 260 000 ක් විය. 2013.04.01 දිනට තොගය රු. 20 000 කින් අවතක්සේරු වී ඇති බවත්, 2014.03.31 දිනට තොගය රු. 30 000 කින් අධිතක්සේරු වී ඇති බවත්, පසුව අනාවරණය විය. තව ද අයිතිකරු සතු ගොඩනැගිල්ලක් භාවිත කිරීම වෙනුවෙන් ව්‍යාපාරය විසින් අයිතිකරුට ගෙවන ලද කුලිය රු. 60 000 ක් සටහන් වී නොමැත.

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** දළ ලාභය සහ ශුද්ධ ලාභය:

| | දළ ලාභය (රු.) | ශුද්ධ ලාභය (රු.) |
|---|---|---|
| (1) | 730 000 | 200 000 |
| (2) | 790 000 | 150 000 |
| (3) | 830 000 | 190 000 |
| (4) | 850 000 | 210 000 |
| (5) | 890 000 | 250 000 |

(......)

**14.** පහත තොරතුරු ආයතනයක් සතු මෝටර් රථ හා බැඳේ.

| | රු.'000 |
|---|---|
| 2013.04.01 දිනට මෝටර් රථ - පිරිවැයට | 4 000 |
| 2013.04.01 දිනට සමුච්චිත ක්ෂය | 750 |
| 2013.10.01 දින මෝටර් රථයක් විකිණීමෙන් ලද මුදල (2011.04.01 දින රු. 1 500 000 ක පිරිවැයට මිල දී ගත්) | 1 000 |
| 2014.01.01 දින මෝටර් රථයක් මිල දී ගැනීම | 5 000 |

මෝටර් රථ වාර්ෂික ව 10% බැගින් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර මිල දී ගත් දින සිට භාවිතය සඳහා යොදා ගත හැක.

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මෝටර් රථ සඳහා ක්ෂය සහ මෝටර් රථය විකුණුම් මත අලාභය කොපමණ ද?

| | ක්ෂය (රු.) | අලාභය (රු.) |
|---|---|---|
| (1) | 375 000 | 200 000 |
| (2) | 400 000 | 350 000 |
| (3) | 450 000 | 125 000 |
| (4) | 525 000 | 500 000 |
| (5) | 900 000 | 50 000 |

(......)

**15.** 2013.04.01 දින යාවජීව සාමාජිකයන් 10 දෙනෙකු ද ඇතුළත් ව සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත ක්‍රීඩා සමාජයක් ආරම්භ කරන ලදී. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 5 000 කි. යාවජීව සාමාජිකයකු වීම සඳහා වසර 10 ක සාමාජික මුදල් එකවර මුදලින් ගෙවිය යුතු වේ. බැඳුනු වසරේ සිට වසර 10 ක කාලයක් තුළ යාවජීව සාමාජික මුදල්, ආදායම තුළ සමානව හඳුනාගනී. අනෙකුත් සාමාජිකයන් 20 දෙනා අතුරෙන් 5 දෙනෙකු මාස හයක් සඳහා ද, 8 දෙනෙකු වසරක් සඳහා ද සහ ඉතිරි අය වසර දෙකක් සඳහා ද සාමාජික මුදල් ගෙවා ඇත.

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජික මුදල් ආදායම සහ මුදලින් ලද සාමාජික මුදල:

| | සාමාජික මුදල් ආදායම (රු.) | මුදලින් ලද සාමාජික මුදල (රු.) |
|---|---|---|
| (1) | 100 000 | 110 000 |
| (2) | 100 000 | 122 500 |
| (3) | 150 000 | 610 000 |
| (4) | 150 000 | 622 500 |
| (5) | 600 000 | 622 500 |

(......)

**16.** පහත කුමන ප්‍රකාශ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වැනි වගන්තියට අනුකූල වන්නේ ද ?

A - හවුල්කරුවන් අතර ලාභඅලාභ සමසම ව බෙදා ගත යුතු ය.
B - හවුල්කරුවන් ඔවුන්ගේ ප්‍රාග්ධන ශේෂ මත පොලියකට හිමිකම් ලබයි.
C - හවුල්කරුවන් වැටුප් සඳහා හිමිකම් නොලබයි.
D - විශ්‍රාම ගිය හවුල්කරුවකුගේ නොපිය වූ ශේෂයක් මත පොලී ගෙවිය හැක.

(1) A හා C පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

**17.** හවුල් ව්‍යාපාරයක ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධ ව පහත ඇ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) හවුල්කරුවන්ට ලාභඅලාභ විසර්ජනය කරනුයේ හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව ය.
(2) හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස් වන විට එහි කීර්තිනාමය ඇස්තමේන්තු කර ගලපනු ලබයි.
(3) හවුල්කරුවන්ට වැටුප් දෙනු ලබන්නේ ඒ සඳහා ප්‍රතිපාදනයක් හවුල් ගිවිසුමේ ඇතුළත් කළ විට ය.
(4) හවුල් ව්‍යාපාරයේ ලාභඅලාභ විසර්ජනය කිරීමේ දී හවුල්කරුවන්ගේ ගැතිලි අඩු නොකරයි.
(5) හවුල්කරුවකු විසින් හවුල් ව්‍යාපාරයට දෙන ලද ණය මුදලක පොලිය ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනා නොගනී.

(......)

**18.** සමාගමක ගිණුම් වර්ෂය 2014.03.31 දිනෙන් අවසන් විය. අධ්‍යක්ෂකවරුන් විසින් 2014.06.30 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දෙන ලදී. 2014.07.15 දින සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන ලදී. 2014.03.31 දිනට පසුව පහත සිද්ධීන් සමාගමට අදාළ ව සිදු විය.

A - 2014.03.31 දිනට රු. 500 000 ක ශේෂයක් සතු ණයගැතියකු 2014.04.30 දින බුන්වත් විය.
B - 2014.03.31 දිනට රු. 800 000 ක ශේෂයක් සතු ණයගැතියකු 2014.07.10 දින බුන්වත් විය.
C - 2014.03.31 දිනට රු. 600 000 ක පිරිවැයට අගය කළ තොගයක් 2014.04.10 දින රු. 550 000 කට විකුණන ලදී.
D - 2014.04.30 දින සිට 2014.06.30 දින අතර කාලයේ දී ආයෝජනවල වෙළෙඳපොළ වටිනාකම රු. 300 000 කින් අඩු විය.

ඉහත කුමන සිද්ධීන් 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතු ද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

**19.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමකට අදාළ ව පහත තොරතුරු දී ඇත.

| | රු. |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 800 000 |
| වර්ෂය සඳහා ක්ෂය | 100 000 |
| තොගයේ වැඩි වීම | 120 000 |
| ණයගැතියන්ගේ අඩු වීම | 200 000 |
| ණයහිමියන්ගේ වැඩි වීම | 180 000 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 640 000 (2) රු. 800 000 (3) රු. 900 000 (4) රු. 960 000 (5) රු. 1 160 000 (......)

**20.** පහත කුමන ප්‍රකාශ, සමාගමක 'මුළු විස්තීරණ ආදායම' සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?

A - එය කාලච්ඡේදයේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම යන දෙකෙහි එකතුවයි.
B - එය කාලච්ඡේදයක් තුළ හඳුනාගත් සියලුම ආදායම් සහ වියදම් අතර වෙනසයි.
C - එය කාලච්ඡේදයක් තුළ හඳුනාගත් සියලුම මෙහෙයුම් ආදායම් සහ වියදම් අතර වෙනසයි.
D - එය කාලච්ඡේදයක් තුළ අයිතිකරුවන් විසින් අයිතිකරුවන් ලෙස සිදු කරන ගනුදෙනු සහ සිද්ධිවලින් හැර අනිකුත් ගනුදෙනු සහ සිද්ධි තුළින් සිදුවන හිමිකමේ වෙනසයි.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා D පමණි.
(4) C හා D පමණි. (5) A, B හා D පමණි. (......)

**21.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධව පහත තොරතුරු දී ඇත.

| | රු. |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය | 500 000 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත හිඟය | 150 000 |
| මෝටර් රථ විකිණීමෙන් ලද ලාභය | 50 000 |

2013.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් ජනනය වූ අතිරික්තය රු. 100 000 ක් විය. මෙම ගනුදෙනු සහ සිද්ධි නිසා 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ ලාභයෙහි සහ මුළු විස්තීරණ ආදායමෙහි **ශුද්ධ අඩුවීම** කොපමණ ද?

| | **ලාභයෙහි ශුද්ධ අඩු වීම (රු.)** | **මුළු විස්තීරණ ආදායමේ ශුද්ධ අඩු වීම (රු.)** |
|---|---|---|
| (1) | 450 000 | 150 000 |
| (2) | 500 000 | 100 000 |
| (3) | 500 000 | 600 000 |
| (4) | 600 000 | 500 000 |
| (5) | 600 000 | 600 000 |

(......)

**22.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී සමාගමක පහත ගනුදෙනු සහ සිද්ධි සිදු විය.

A - රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරමින් රු. 500 000 ක් වටිනා සාමාන්‍ය කොටස් නිකුත් කරන ලදි.
B - රු. 120 000 ක අතිරික්තයක් ජනනය කරමින් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදි.
C - ස්ථාවර තැන්පතුවක් මත රු. 80 000 ක පොලියක් උපයන ලදි.
D - සාමාන්‍ය කොටස්කරුවන්ට රු. 140 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදි.

මෙම ගනුදෙනු සහ සිද්ධි නිසා 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හිමිකමෙහි සිදු වූ **ශුද්ධ වැඩිවීම** කොපමණ ද?

(1) රු. 60 000 (2) රු. 200 000 (3) රු. 360 000 (4) රු. 500 000 (5) රු. 560 000 (......)

- **ප්‍රශ්න අංක 23 සහ 24 ට පිළිතුරු සැපයීමට සමාගමක පහත තොරතුරු භාවිත කරන්න.**

| | **2014.03.31 දිනට (රු.)** | **2013.03.31 දිනට (රු.)** |
|---|---|---|
| මුළු වත්කම් | 2 200 000 | 1 800 000 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 500 000 | 500 000 |
| රඳවාගත් ඉපැයුම් | 700 000 | 300 000 |

**2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:**

| | රු. |
|---|---|
| සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ අතුරු ලාභාංශ | 100 000 |
| බැංකු ණය මත පොලී | 125 000 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 75 000 |

**23.** 2014.03.31 දිනට සමාගමේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේ දී භාවිත කරන ලාභය:

(1) රු. 300 000 (2) රු. 400 000 (3) රු. 500 000 (4) රු. 600 000 (5) රු. 700 000 (......)

**24.** සමාගමේ මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (සාමාන්‍ය මුළු වත්කම් මත):

(1) 15% (2) 20% (3) 25% (4) 30% (5) 35% (......)

**25.** නිෂ්පාදන ආයතනයක් විසින් දරන ලද පහත කුමන පිරිවැය අයිතම සෘජු පිරිවැය ලෙස වර්ග කෙරේ ද?

A - නිෂ්පාදනය කරන ලද ඒකක ගණන මත සේවකයන්ට ගෙවූ වේතන
B - නිෂ්පාදන කළමනාකරුට ගෙවූ මාසික වැටුප
C - අමුද්‍රව්‍ය කම්හලට ගෙන ඒම සඳහා දැරූ ප්‍රවාහන පිරිවැය
D - කම්හලේ භාවිත කරන යන්ත්‍රය මත ක්ෂය වෙන් කිරීම

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, C හා D පමණි. (......)

**25.** නිෂ්පාදන ආයතනයක් විසින් දරන ලද පහත කුමන පිරිවැය අයිතම සෘජු පිරිවැය ලෙස වර්ග කෙරේ ද?

A - නිෂ්පාදනය කරන ලද ඒකක ගණන මත සේවකයන්ට ගෙවූ වේතන
B - නිෂ්පාදන කළමනාකරුට ගෙවූ මාසික වැටුප
C - අමුද්‍රව්‍ය කම්හලට ගෙන ඒම සඳහා දැරූ ප්‍රවාහන පිරිවැය
D - කම්හලේ භාවිත කරන යන්ත්‍රය මත ක්ෂය වෙන් කිරීම

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, C හා D පමණි. (......)

**26.** එකම කාලච්ඡේදයක් තුළ සමාගමක ක්‍රියාකාරී මට්ටම් දෙකක අයවැයගත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය පහත දී ඇත.

| ක්‍රියාකාරී මට්ටම (ඒකක) | අයවැයගත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.) |
|---|---|
| 30 000 | 225 000 |
| 40 000 | 275 000 |

ඒකකයක ප්‍රාථමික පිරිවැය රු. 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
ක්‍රියාකාරී මට්ටම ඒකක 40 000 ක් වන විට මුළු විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය:

| | මුළු විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.) | මුළු නිෂ්පාදන පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 50 000 | 525 000 |
| (2) | 50 000 | 675 000 |
| (3) | 200 000 | 675 000 |
| (4) | 200 000 | 825 000 |
| (5) | 275 000 | 675 000 |

(......)

**27.** පහත තොරතුරු වර්ෂයක් තුළ දී නිෂ්පාදන සමාගමක් විසින් භාවිත කළ 'A' නැමැති අමුද්‍රව්‍යයට අදාළ වේ.

| | අවම | උපරිම |
|---|---|---|
| පරිභෝජනය (ඒකක) | 2 000 | 5 000 |
| පොරොත්තු කාලය (මාස) | 4 | 6 |

උපරිම තොග මට්ටම ඒකක 42 000 කි.

මෙම අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය:

| | යළි ඇණවුම් මට්ටම (ඒකක) | යළි ඇණවුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| (1) | 17 500 | 32 500 |
| (2) | 20 000 | 30 000 |
| (3) | 20 000 | 39 500 |
| (4) | 30 000 | 20 000 |
| (5) | 30 000 | 29 500 |

(......)

**28.** සමාගමක කම්හල් සේවකයන් සඳහා ඒකකයකට රු. 10 ක වේතන රේටයක් ගෙවනු ලබයි. වැඩ කරන පැය ගණන 8 ක් වූ දිනක දී, සෑම මිනිත්තු 30 ක් තුළ දී භාණ්ඩ ඒකක 10 ක් නිෂ්පාදනය කිරීම අපේක්ෂා කෙරේ. එක් දිනක දී අපේක්ෂිත ප්‍රමාණයට වඩා නිපදවනු ලබන ඒකකයන්ට, ඒකකයකට රු. 15 ක් බැගින් ගෙවනු ලැබේ.
එක්තරා දිනයක දී අමල්, බිමල් සහ චමල් යන සේවකයන් තිදෙනා භාණ්ඩ ඒකක 160 ක්, 200 ක් සහ 150 ක් පිළිවෙළින් නිපදවූයේ නම් ඔවුන්ගේ මුළු වේතන:

| | අමල් (රු.) | බිමල් (රු.) | චමල් (රු.) |
|---|---|---|---|
| (1) | 1 600 | 2 200 | 1 350 |
| (2) | 1 600 | 2 200 | 1 500 |
| (3) | 1 600 | 2 200 | 1 600 |
| (4) | 1 600 | 3 000 | 1 500 |
| (5) | 1 600 | 3 000 | 1 600 |

(......)

**29.** ස්ථාවර පිරිවැය නොවෙනස්ව තිබිය දී, ඒකක විකුණුම් මිල සහ ඒකක විචල්‍ය පිරිවැය යන දෙකම 15% බැගින් අඩු වූ විට ඒකක දායකයට සහ දායක විකුණුම් අනුපාතයට ඇති වන බලපෑම:

| | ඒකක දායකය | දායක විකුණුම් අනුපාතය |
|---|---|---|
| (1) | අඩු වේ | වෙනස් නොවේ |
| (2) | අඩු වේ | අඩු වේ |
| (3) | අඩු වේ | වැඩි වේ |
| (4) | වෙනස් නොවේ | වෙනස් නොවේ |
| (5) | වෙනස් නොවේ | අඩු වේ |

(......)

**30.** අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී, පහත කුමක් ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩිවීමට** බලපායි ද?

A - වට්ටම් අනුපාතය අඩුවීම
B- වාර්ෂික ක්ෂය අඩුවීම
C - ආරම්භක ආයෝජනය අඩුවීම
D- ශුද්ධ මෙහෙයුම් මුදල් ගලා ඒම් අඩුවීම

(1) A හා C පමණි. (2) C හා D පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D සියල්ලම. (......)

2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 4 | 16. | 1 |
| 02. | 4 | 17. | 5 |
| 03. | 2 | 18. | 2 |
| 04. | 2 | 19. | 5 |
| 05. | 1 | 20. | 5 |
| 06. | 3 | 21. | 3 |
| 07. | 2 | 22. | 1 |
| 08. | 3 | 23. | 3 |
| 09. | 2 | 24. | 5 |
| 10. | 1 | 25. | 2 |
| 11. | 4 | 26. | 3 |
| 12. | 1 | 27. | 4 |
| 13. | 2 | 28. | 2 |
| 14. | 3 | 29. | 1 |
| 15. | 4 | 30. | 1 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **04** බැගින් මුළු ලකුණු **120**කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** මූල්‍ය ගිණුම්කරණ සහ කළමනාකරණ ගිණුම්කරණ වාර්තා අතර වෙනස්කම් පහත කරුණු මත සඳහන් කරන්න.

| කරුණ | වාර්තා: මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| A - වාර්තා භාවිත කරන පාර්ශ්ව | ................................ | ................................ |
| B - පිළියෙල කරන වාර ගණන | ................................ | ................................ |
| C - නෛතික අවශ්‍යතාව | ................................ | ................................ |
| D - වාර්තා කරන තොරතුරුවල ස්වභාවය | ................................ | ................................ |

පිළිතුර

| 31. | මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| A | අභ්‍යන්තර හා බාහිර (ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශව) | අභ්‍යන්තර (කළමනාකරුවන්) (01) |
| B | සාමාන්‍යයෙන් වාර්ෂිකව | අවශ්‍ය වූ විට (01) |
| C | අවශ්‍යතාවයකි | අවශ්‍යතාවයක් නොවේ (01) |
| D | අතීත | අතීත හා පුරෝකථනය කරන ලද (01) |

**32.** අදාළ තීරුවෙහි ' √ ' ලකුණක් යොදමින් ආයතනයකට අදාළ ව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|
| A - ණයගැතියකුගෙන් මුදල් ලද විට හිමිකම වැඩි වේ. | ............... | ............... |
| B - ණයක් මත පොලී ගෙවූ විට හිමිකම අඩු වේ. | ............... | ............... |
| C - සාමාන්‍ය කොටස්කරුවන්ට ලාභාංශ ගෙවූ විට වර්ෂයේ ලාභය අඩු වේ. | ............... | ............... |
| D - වර්ෂයක් තුළ ලාභයක් ඉපැයූ විට වසර අග මුදල් ශේෂය හැමවිට ම වැඩි වේ. | ............... | ............... |

පිළිතුර

| 32. | සත්‍ය | අසත්‍ය | |
|---|---|---|---|
| A | | √ | (01) |
| B | √ | | (01) |
| C | | √ | (01) |
| D | | √ | (01) |

**33.** පහත ගිණුම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සහ හිමිකම් ලෙස වර්ග කරන්න.

| ගිණුම | වර්ගීකරණය |
|---|---|
| A - අඩමාණ ණය සඳහා වෙන් කිරීම | ................................................ |
| B - කලින් ලද කුලී ආදායම | ................................................ |
| C - රඳවාගත් ඉපැයුම් | ................................................ |
| D - බොල් ණය | ................................................ |

පිළිතුර

33. A - වත්කම් (01)
B - වගකීම් (01)
C - හිමිකම් (01)
D - වියදම් (01)

**34.** 2014.03.31 දිනට ආයතනයක බැංකු ගිණුමේ ශේෂය රු. 680 000 ක් විය. නමුත් එය එදින බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවී ය. මෙම වෙනසට හේතු වූයේ පහත දෑ ය.

1. ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 10 000 ක් පොත්වල සටහන් වී නොමැත.
2. බැංකුවේ තැන්පත් කළ රු. 40 000 ක චෙක්පතක් උපලබ්ධි වී නොමැත.

(අ) 2014.03.31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය කොපමණ ද? රු. ......................................................

(ආ) 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වනු ලබන බැංකු ශේෂය කොපමණ ද? රු. ........................

## පිළිතුර

34. (අ) රු 630 000 (02)
(ආ) රු 670 000 (02)

**35.** ආයතනයක පොදු ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනු වර්ග **දෙකක්** සඳහන් කරන්න.

1. ......................................................................................................................................
2. ......................................................................................................................................

## පිළිතුර

35.
- ආරම්භක සටහන්
- වැරදි නිවැරදි කිරීමේ සටහන්
- ජංගම නොවන වත්කම් ණයට මිලදී ගැනීම
- ජංගම නොවන වත්කම් ඉවත් කිරීම
- පියවීමේ සටහන්
- ගැළපුම් සටහන්
- ජංගම නොවන වත්කම් ණයට විකිණීම
- ජංගම නොවන වත්කම් හුවමාරු කිරීම

**(ඕනෑම ගනුදෙනු වර්ග දෙකකට 02 බැගින් 04යි)**

**36.** ලාභ අරමුණුකර නොගත් සංවිධානයක පහත තොරතුරු ලබාගත හැකි ගිණුම් නම් කරන්න.

| **තොරතුර** | **ගිණුම** |
|---|---|
| A - වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම | ...................................................... |
| B - වර්ෂය තුළ මුදල් ගලා ඒම් සහ ගලා යාම් | ...................................................... |

## පිළිතුර

36. A - ආදායම් හා වියදම් ගිණුම / සාමාජික මුදල් ගිණුම (02)
B - ලැබීම් හා ගෙවීම් ගිණුම / මුදල් පොත / බැංකු ගිණුම (02)

**37.** 2013.04.01 දින සුමුදු වෙළෙන්දෝ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. එය පිරිවැය මත 25%ක ලාභ ආන්තිකයක් පවත්වා ගනිමින් භාණ්ඩ විකුණනු ලබයි. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් රු. 625 000 ක් විය. 2014.03.31 දිනට තොගයේ පිරිවැය රු. 20 000 කි.

පහත දෑ ගණනය කරන්න:

(අ) වර්ෂයේ දළ ලාභය රු. ......................................

(ආ) වර්ෂය සඳහා ගැනුම් රු. ......................................

## පිළිතුර

37. (අ) රු 125 000 (02)
(ආ) රු 520 000 (02)

**38.** නිෂ්පාදන සමාගමක පහත එක් එක් අවස්ථාවට **වඩාත්** අදාළ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - වසර අග අමුද්‍රව්‍ය තොගය එහි පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම් කිරීම. | .......................................... |
| B - සෑම ගිණුම් කාලච්ඡේදයක් සඳහා ම නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීම. | .......................................... |
| C - භාණ්ඩ භාරදීමට පෙර ගනුදෙනුකරුවකුගෙන් ලද අත්තිකාරමක් වගකීමක් ලෙස හඳුනාගැනීම. | .......................................... |
| D - යන්ත්‍රයක් මත වෙන් කරන ලද ක්ෂය, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් ලෙස නිෂ්පාදන ගිණුමෙහි හඳුනාගැනීම. | .......................................... |

පිළිතුර

38. A - ආරක්ෂණ / විචක්ෂණ (01)
    B - කාලච්ඡේද (01)
    C - උපචිත / උපලබ්ධි/ ආදායම් හඳුනා ගැනීම (01)
    D - ගැළපුම් (01)

**39.** වෙළෙඳ ව්‍යාපාරයක යෙදෙන සමාගමක පහත අයිතම මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ආදායමක් ලෙස හඳුනාගත හැකි ද යන්න සඳහන් කරන්න.

| අයිතමය | ආදායමක් ලෙස හඳුනාගැනීම (ඔව්/ නැත) |
|---|---|
| A - අත්පිට විකුණුම් | ..................................... |
| B - ගොඩනැගිල්ලක් විකිණීමෙන් ලද මුදල | ..................................... |
| C - ස්ථාවර තැන්පතුවක් මත ප්‍රවර්තන වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය | ..................................... |
| D - මෝටර් රථ ප්‍රථමවර ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | ..................................... |

පිළිතුර

39. A - ඔව් (01)
    B - නැත (01)
    C - ඔව් (01)
    D - ඔව් (01)

- **ප්‍රශ්න අංක 40, 41 සහ 42 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

අනෝමා සහ බිමල්කා 3:2 අනුපාතයට ලාභඅලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2013.04.01 දින චමිලා හවුල්කරුවකු ලෙස හවුල් ව්‍යාපාරයට බැඳුනි. මෙදින චමිලා විසින් රු. 1 200 000 ක් මුදලින් ප්‍රාග්ධනය සඳහා දායක වූ අතර කීර්තිනාමය රු. 2 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාමය වත්කමක් ලෙස පොත්වල හඳුනා නොගන්නා අතර ඒ සඳහා සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදු කෙරේ. මෙදින සිට අනෝමා, බිමල්කා සහ චමිලා, 3:2:1 අනුපාතයට ලාභඅලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වූ අතර එක් එක් හවුල්කරුවාට රු. 120 000 ක වාර්ෂික වේතනයක් හිමි ය.

2013.03.31 දිනට අනෝමා සහ බිමල්කාගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් පහත පරිදි විය.

| | අනෝමා (රු.) | බිමල්කා (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 2 000 000 | 1 500 000 |
| ජංගම ගිණුම | 300 000 | 200 000 |

වර්ෂය තුළ දී චමිලා රු. 80 000 ක් ගැනිලි ලෙස මුදලින් ලබා ගන්නා ලදී. 2014.03.31 දින ඇයගේ ජංගම ගිණුමේ ශේෂය රු. 280 000 ක් විය. අනිකුත් හවුල්කරුවන් දෙදෙනා 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගැනිලි ලෙස මුදල් ලබාගෙන නොමැත.

**40.** 2013.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ගැළපීම සඳහා ජර්නල් සටහන ලියා දක්වන්න. (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ*)

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

පිළිතුර

40.

| | | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් - අනෝමා | හර | 1 200 | |
| බිමල්කා | හර | 800 | |
| චමිලා | හර | 400 | |
| ප්‍රාග්ධන ගිණුම් - අනෝමා | | | 1 440 |
| බිමල්කා | | | 960 |

(04)

හෝ

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම - චමිලා හර<br>ප්‍රාග්ධන ගිණුම් - අනෝමා<br>බිමල්කා | 400 | <br>240<br>160 |

(04)

**41.** **2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය: රු. ..............................................**

## පිළිතුර

41. රු 1 800 000 (04)

**42.** **2014.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකම: රු. ..............................................**

## පිළිතුර

42. රු 6 920 000 (04)

**43.** **2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී සමාගමක් කොටසක් රු. 30 බැගින් සාමාන්‍ය කොටස් 100 000 ක් නිකුත් කරන මුළු මුදල ද සමඟ කොටස් 150 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. සමාගම කොටස් 100 000 සමානුපාතිකව විභජනය ක ළද අතර අතිරික්ත මුදල් අයදුම්කරුවන් වෙත නැවත යවන ලදී.**

**පහත දෑ සඳහා ජර්නල් සටහන් ලියා දක්වන්න.** ***(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)***

**(අ) අයදුම්පත් සමඟ මුදල් ලැබීම**

..............................................

..............................................

**(ආ) කොටස් විභජනය කිරීම**

..............................................

..............................................

## පිළිතුර

43.

| | හර (රු.'000) | බැර (රු.'000) | |
|---|---|---|---|
| (අ) මුදල් / බැංකු හර<br>කොටස් නිකුත් කිරීමේ ගිණුම / අයදුම් හා විභජන ගිණුම | 4 500 | <br>4 500 | (02) |
| (ආ) කොටස් නිකුත් කිරීමේ ගිණුම / අයදුම් හා විභජන ගිණුම හර<br>ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ගිණුම | 3 000 | <br>3 000 | (02) |

**44.** **අදාළ තීරුවේ ' √ ' ලකුණක් යොදමින් වෙළෙඳ සමාගමක පහත ගනුදෙනු තුළින් ඇති වන මුදල් ගලා යාම් මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ග කරන්න.**

| ගනුදෙනුව | ක්‍රියාකාරකම්: මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|
| A - භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් පියවීම | ............... | ............... | ............... |
| B - කල්බදු ණයහිමියකුට වාර්ෂික කල්බදු වාරිකය ගෙවීම | ............... | ............... | ............... |
| C - සාමාන්‍ය කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීම | ............... | ............... | ............... |
| D - මෝටර් රථයක් මුදලට මිල දී ගැනීම | ............... | ............... | ............... |

පිළිතුර

44.

| | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය | |
|---|---|---|---|---|
| A | √ | | | (01) |
| B | | | √ | (01) |
| C | | | √ | (01) |
| D | | √ | | (01) |

**45.** සුදුසු තීරුවේ ' √ ' ලකුණක් යොදමින් අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|---|
| A | ප්‍රතිපාදනයක් යනු නිශ්චිත කාලයක් හෝ ප්‍රමාණයක් නොමැති වගකීමකි. | ................. | ................. |
| B | අසම්භාව්‍ය වගකීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනී. | ................. | ................. |
| C | ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ප්‍රවර්තන සහ අනාගත ගිණුම් කාලච්ඡේදවල ගළපයි. | ................. | ................. |
| D | ආයතනයක ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීම සෑම විටම කළමනාකරුවන්ගේ අභිමතය පරිදි සිදු වේ. | ................. | ................. |

පිළිතුර

45.

| | සත්‍ය | අසත්‍ය | |
|---|---|---|---|
| A | √ | | (01) |
| B | | √ | (01) |
| C | √ | | (01) |
| D | | √ | (01) |

**46.** පහත එක් එක් ගනුදෙනුව සමාගමක ක්ෂණික අනුපාතය මත කරනු ලබන බලපෑම **වැඩි වේ** ද, **අඩු වේ** ද, **වෙනස් නොවේ** ද යන්න සඳහන් කරන්න.

| | ගනුදෙනුව | බලපෑම |
|---|---|---|
| A | ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | ............................................ |
| B | ණය පදනම මත මිල දී ගත් භාණ්ඩ ආපසු යැවීම | ............................................ |
| C | ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ වාරික ගෙවීම | ............................................ |
| D | මෝටර් රථයක් විකිණීමෙන් මුදල් ලැබීම | ............................................ |

පිළිතුර

46. A - වෙනස් නොවේ (01)
B - වැඩි වේ (01)
C - අඩු වේ (01)
D - වැඩි වේ (01)

**47.** 2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක විකුණුම් රු. 9 000 000 ක් වූ අතර එයින් 80% ක් ණයට විකුණුම් ය සමාගමේ විකුණුම් මත දළ ලාභ ආන්තිකය 30% කි. පහත තොරතුරු ද දී තිබේ.

| | 2014.03.31 දිනට (රු.) | 2013.03.31 දිනට (රු.) |
|---|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1 000 000 | 800 000 |
| තොගය | 500 000 | 900 000 |

වර්ෂය තුළ වැඩ කරන දින ගණන 360 ක් ලෙස උපකල්පනය කරමින් 2014.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(අ) ණයගැති පිරිවැටුම් අනුපාතය ............................................

(ආ) තොග රැඳවුම් කාලය ............................................

පිළිතුර

47. (අ) වාර 08 (02) (ආ) දින 40 (02)

**48.** නිෂ්පාදන සමාගමක පිරිවැය දත්ත පහත දී ඇත.

| | | |
|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | ඒකකයකට | රු. 15 |
| සෘජු ශ්‍රමය | ඒකකයකට | රු. 25 |
| විචල්‍ය පොදුකාර්ය පිරිවැය: | | |
| නිෂ්පාදන | ඒකකයකට | රු. 10 |
| නිෂ්පාදන නොවන | ඒකකයකට | රු. 15 |
| ස්ථාවර පොදුකාර්ය පිරිවැය: | | |
| නිෂ්පාදන | | රු. 50 000 |
| නිෂ්පාදන නොවන | | රු. 30 000 |

ඉලක්ක නිෂ්පාදනය ඒකක 1 000 ක දී පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. ..................................

(ආ) මුළු පොදු කාර්ය පිරිවැය රු. ..................................

(ඉ) මුළු විචල්‍ය පිරිවැය රු. ..................................

පිළිතුර

48. (අ) රු 60 000 (01) (ආ) රු 105 000 (01) (ඉ) රු 65 000 (02)

**49.** සමාගමක් නිෂ්පාදනය කරන ' X ' නමැති භාණ්ඩයට පහත තොරතුරු අදාළ වේ.

| | |
|---|---|
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු. 90 |
| ස්ථාවර පිරිවැය | රු. 60 000 |
| දායක විකුණුම් අනුපාතය | 40% |

පහත දෑ ගණනය කරන්න.

(අ) සමච්ඡේදන ලක්ෂ්‍යය රු. ..................................

(ආ) ඒකක 1 200 මට්ටමේ දී අපේක්ෂිත ලාභය රු. ..................................

පිළිතුර

49. (අ) රු 150 000 (02) (ආ) රු 12 000 (02)

**50.** සීමිත බෙන්සන් පොදු සමාගම නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රය මිල දී ගතහොත්, දැනට භාවිතයේ පවතින යන්ත්‍රය රු. 200 000 කට විකිණිය හැක. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 4 ක් වන අතර ඊට අදාළ අනිකුත් තොරතුරු පහත දැක්වේ.

| | රු.'000 |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | 600 |
| ස්ථාපිත කිරීමේ පිරිවැය | 50 |
| 4 වන වසර අග සුන්බුන් අගය | 120 |
| ආරම්භයේ දී අවශ්‍ය වන කාරක ප්‍රාග්ධනය | 100 |
| අපේක්ෂිත වාර්ෂික මුදල් ගලා ඒම් | 240 |

පහත දෑ ගණනය කරන්න.

(අ) ආරම්භක ආයෝජනය රු. ..................................

(ආ) 4 වන වර්ෂය සඳහා මුළු මුදල් ගලා ඒම් රු. ..................................

පිළිතුර

50. (අ) රු 550 000 (02) (ආ) රු 460 000 (02)

* * *

### 2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:

I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




* මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 1, 3, 4, 32, 33 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 70%කට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සැපයීමට සමත් වී ඇති බව ඉහත ප්‍රස්තාරයට අනුව පෙනේ.

* එමෙන්ම ගිණුම්කරණ සංකල්ප, ශ්‍රම පිරිවැය, ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශ ආශ්‍රිත මූලික කරුණු පිළිබඳ ව ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 06, 28, 36, 44 ප්‍රශ්නවලට ද අයදුම්කරුවන්ගෙන් 70%කට වඩා සාර්ථකව පිළිතුරු සපයා ඇත.

* ප්‍රශ්න අංක 7, 12, 21, 24, 29, 41, 42, 49, 50 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 30%ක් හෝ ඊට අඩුවෙනි. එම අංකවලින් පෙන්නුම් කරන්නේ මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව, VAT ගැලපුම්, මූල්‍ය ගිණුම්කරණ අනුපාත, පිරිවැය ලාභ පරිමා විශ්ලේෂණය, හවුල් ව්‍යාපාර සහ ප්‍රාග්ධන ආයෝජන තීරණ වේ. මෙම මාතෘකා පිළිබඳ ව සිසුන්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවන බව කිව හැක. ඒ අනුව ඉහත විෂය කරුණුවල යෙදීම් පිළිබඳ ව ප්‍රායෝගික නිදසුන් සහිත ව පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

* ප්‍රශ්න අංක 8, 13, 16, 20, 22, 23, 26, 30, 37, 40, 43, 46, 47, 48 යන ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 30%-50% අතර ප්‍රතිශතයකි. එම ප්‍රශ්නවලින් පරීක්ෂාවට ලක් කර ඇත්තේ වැරදි නිවැරදි කිරීම, තොගය හා ලාභය අතර සම්බන්ධතාවය, හවුල් ව්‍යාපාර, මුළු විස්තීරණ ආදායම, හිමිකමට වන බලපෑම, ගිණුම්කරණ අනුපාත, පොදු කාර්ය පිරිවැය, ප්‍රාග්ධන ආයෝජන තීරණ, සමාගමක කොටස් නිකුත් කිරීම සහ පිරිවැය වර්ගීකරණය යන කොටස් පිළිබඳ දැනුම හා අවබෝධයයි.

* ප්‍රශ්න අංක 2, 5, 9, 10, 11, 14, 15, 17, 18, 19, 25, 27, 31, 34, 35, 38, 39, 45 යන ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 51%-69% අතර ප්‍රතිශතයකි. එම ප්‍රශ්නවලින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ ගිණුම්කරණ සමීකරණය, ගිණුම්කරණ සංකල්ප, පාලන ගිණුම්, වට්ටම් වර්ග, පිරිවැය සූත්‍ර, දේපල පිරියත, උපකරණ ඉවත් කිරීම් සම්බන්ධ ගිණුම්කරණය, ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම්, හවුල් ව්‍යාපාර, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රමිත, පිරිවැය වර්ගීකරණය, බැංකු සැසඳුම් ප්‍රකාශනය, මූලික පොත් යන කොටස් පිළිබඳ දැනුම සහ අවබෝධයයි.

* ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉහත විෂයය කොටස් සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරමින් ප්‍රායෝගික මට්ටමේ නිපුණතා පාදක කරගෙන අදාළ ගැටළු හා පිළිතුරු සාකච්ඡා කරන්නේ නම් සිසුනට වඩාත් ප්‍රයෝජනවත් බව කිව හැකිය.

2.1.6 I වන ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 1 | 4 | 2% | 2% | 5% | 90% | 1% | 0% |
| 2 | 4 | 13% | 12% | 11% | 58% | 5% | 1% |
| 3 | 2 | 8% | 76% | 10% | 5% | 1% | 0% |
| 4 | 2 | 1% | 70% | 12% | 1% | 16% | 0% |
| 5 | 1 | 50% | 6% | 10% | 18% | 13% | 2% |
| 6 | 3 | 4% | 6% | 71% | 14% | 4% | 1% |
| 7 | 2 | 3% | 12% | 3% | 11% | 70% | 1% |
| 8 | 3 | 21% | 24% | 38% | 10% | 6% | 2% |
| 9 | 2 | 7% | 63% | 8% | 7% | 14% | 1% |
| 10 | 1 | 51% | 22% | 10% | 12% | 4% | 1% |
| 11 | 4 | 7% | 8% | 12% | 66% | 6% | 1% |
| 12 | 1 | 18% | 14% | 28% | 9% | 30% | 1% |
| 13 | 2 | 8% | 38% | 26% | 15% | 12% | 1% |
| 14 | 3 | 11% | 10% | 60% | 12% | 7% | 1% |
| 15 | 4 | 4% | 20% | 12% | 53% | 9% | 1% |
| 16 | 1 | 36% | 7% | 19% | 34% | 5% | 0% |
| 17 | 5 | 2% | 3% | 6% | 22% | 66% | 1% |
| 18 | 2 | 13% | 53% | 5% | 24% | 4% | 1% |
| 19 | 5 | 8% | 14% | 7% | 12% | 58% | 0% |
| 20 | 5 | 22% | 19% | 11% | 7% | 41% | 1% |
| 21 | 3 | 26% | 26% | 25% | 15% | 6% | 1% |
| 22 | 1 | 37% | 13% | 15% | 7% | 27% | 1% |
| 23 | 3 | 10% | 23% | 37% | 13% | 16% | 2% |
| 24 | 5 | 12% | 22% | 32% | 19% | 14% | 2% |
| 25 | 2 | 16% | 60% | 8% | 7% | 8% | 1% |
| 26 | 3 | 6% | 24% | 44% | 8% | 17% | 2% |
| 27 | 4 | 6% | 10% | 10% | 59% | 14% | 1% |
| 28 | 2 | 5% | 74% | 9% | 9% | 2% | 1% |
| 29 | 1 | 24% | 24% | 18% | 19% | 14% | 1% |
| 30 | 1 | 39% | 9% | 18% | 15% | 17% | 2% |

වගුව 01

ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස එක් එක් වරණය තෝරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රතිශත ඉහත වගු අංක 01හි දැක්වේ. එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. ඒ අතුරින් විශේෂතා හඳුනාගත් ප්‍රශ්න කිහිපයක් පිළිබඳ ව විග්‍රහයක් පහත දැක්වේ.

ප්‍රශ්න අංක 07 සඳහා **නිවැරදි පිළිතුර වූ 2 වන වරණය** තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 12%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 70%ක්ම 5 වන වරණය තෝරාගෙන තිබුණි. වත්කමක ලක්ෂණ ලෙස "වත්කමක් හඳුනා ගැනීමේ නිර්ණායක ද" ගෙන තිබීම එයට හේතුව වේ. මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුව පැහැදිලි කිරීමේදී **වත්කමක ලක්ෂණ** හා **හඳුනා ගැනීමේ නිර්ණායක** වෙන වෙන ම අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් වීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 24 සඳහා **නිවැරදි පිළිතුර වූ 5 වන වරණය** තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 14% ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 32%ක්ම සිය පිළිතුර ලෙස තෝරා ඇත්තේ වරණ අංක 03 වේ. එම පිළිතුර තෝරා ගැනීමට හේතුව වී ඇත්තේ අනුපාතය ගණනය කිරීමේදී බදු සහ පොලී පසු ලාභය (කාලච්ඡේදයේ ලාභය) යොදා ගෙන තිබීමයි. අයදුම්කරුවන්ගෙන් 22%ක් 2 වන වරණය තෝරාගෙන ඇත. එයට හේතුව වී ඇත්තේ කාලච්ඡේදයේ ලාභයෙන් අතුරු ලාභාංශ අඩු කළ පසු ලාභය යොදා ගෙන අනුපාතය ගණනය කර තිබීමයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී **මුළු වත්කම්වලට අදාළ ප්‍රතිලාභය** යනු කුමක් ද යන්න සිසුන්ට දැනෙන පරිදි (එනම් බදු හා පොලී පෙර ලාභය බව) අවබෝධයක් ලබාදීම වැදගත් වන බව කිව හැකිය.

ප්‍රශ්න අංක 12 සඳහා **නිවැරදි පිළිතුර වූ 01 වන වරණය** තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 18%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 30%ක් 5 වන වරණය ද, 28%ක් 3 වන වරණය ද, තෝරා ගෙන ඇත. 5 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් යන්ත්‍රයේ පිරිවැයට ගෙවූ VAT එකතු කර ඇති අතර, 3 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් යන්ත්‍රයේ පිරිවැයට VAT එකතු කරන අතර මූලික පරීක්ෂණ පිරිවැය නොසලකා හැර ඇත.

VAT සඳහා ලියාපදිංචි වූ සමාගමක් දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීමේදී ද ගෙවූ VAT ආපසු අය කරගත හැකි බැවින් පිරිවැයට එකතු නොකරන බව එම සිසුන්ට අවබෝධයක් නැති බව පෙනී යන අතර මූලික පරීක්ෂණ පිරිවැය, පිරිවැයට එකතු කිරීමේදී ඒ තුළින් ලද ආදායම කපා හැර පිරිවැයට එකතු කළ යුතු බව පිළිබඳව ද අවබෝධයක් නැති බව පෙනී යයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී LKAS 16 ට අදාළ ව අභ්‍යාස කරවීම වඩාත් උචිත වේ.

ප්‍රශ්න අංක 29 සඳහා **නිවැරදි පිළිතුර වූ 1 වන වරණය** තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 24%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 24%ක් 2 වන වරණය තෝරා ගෙන ඇත. **ඒකකයක විකුණුම් මිල** හා **ඒකකයක විචල්‍ය පිරිවැය යන අංශ දෙකම අඩු වූ විට** යන්න වචනවලින් සලකා, දායකය හා දායක විකුණුම් අනුපාතය අඩුවන බව තේරුම් ගෙන 2 වන වරණය පිළිතුරු ලෙස නිර්දේශ කර ඇත. මින් පැහැදිලි වනුයේ සංඛ්‍යා ආදේශනයකින් තොරව පිළිතුරට නිගමනයක් දී ඇති බවයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී උපකල්පනය කළ සංඛ්‍යා යොදා ගෙන පිළිතුරු සෙවීමට සිසුන් දැනුවත් කිරීම වඩා වැදගත් වේ.

ප්‍රශ්න අංක 21 සඳහා **නිවැරදි පිළිතුර වූ 3 වන වරණය** තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 25%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 26%ක් 1 වන වරණය ද, අයදුම්කරුවන්ගෙන් 26%ක් 2 වන වරණය ද තෝරා ගෙන ඇත. 1 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් ලාභයේ ශුද්ධ අඩුවීමට ප්‍රත්‍යාගණන හිඟය නොසලකා ඇති අතර, මුළු විස්තීරණ ආදායම අඩුවීම වෙනුවට වෙනත් විස්තීරණ ආදායම් අඩුවීම ගෙන ඇති අතර එය ලබාගැනීමේදී ද පෙර වර්ෂයේ තිබූ ප්‍රත්‍යාගණන අතිරික්තය නොසලකා හැර ඇත. 2 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් ලාභයේ ශුද්ධ අඩුවීම නිවැරදි ව ගණනය කර ඇතත් **මුළු විස්තීරණ ආදායම** අඩුවීම වෙනුවට **වෙනත් විස්තීරණ** ආදායම් අඩුවීම් ගෙන ඇත.

පෙර වසරක ප්‍රත්‍යාගණන අතිරික්තයක් හෝ හිඟයක් ඇති විට ප්‍රවර්තන වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තයක් හෝ හිඟයක් ඇති වුවහොත් එය ගැලපීම සිදුවනුයේ කෙසේ ද යන්න හා එය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව අවබෝධ වන ලෙසත්, **වෙනත් විස්තීරණ ආදායම්** හා **මුළු විස්තීරණ ආදායම්** ගොඩනැගෙනුයේ කෙසේ ද යන්න පිළිබඳ ව අවබෝධ වන ලෙසත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගොඩනැගීම වඩා වැදගත් වේ.

ප්‍රශ්න අංක 16 සඳහා **නිවැරදි පිළිතුර වූ 1 වන වරණය** තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 36%කි. අයදුම්කරුවන්ගෙන් 34%ක් 4 වන වරණය තෝරා ගෙන ඇත. 4 වන වරණය තෝරා ගැනීමේදී A හා C නිවැරදි බව දන්නා අතර 24 වන වගන්තිය තුළ ප්‍රාග්ධනයට අතිරේකව යොදනු ලබන ණය සඳහා ලබා දෙන 5% පොලිය මත D නිවැරදි බව නිගමනය කර ඇති බව සිතිය හැකිය. මින් පැහැදිලි වනුයේ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය හා 42 වන වගන්තියේ කොන්දේසි පිළිබඳව අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වන බවයි.

ප්‍රශ්න අංක 22 සඳහා **නිවැරදි පිළිතුර** වන 1 වන **වරණය** තෝරා ගෙන ඇති ප්‍රතිශතය 37%කි. 27%ක් 5 වන වරණය තෝරා ගෙන තිබුණි. 5 වන වරණය තෝරා ගැනීමට හේතුව වී ඇත්තේ **රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම** හිමිකමෙහි වැඩිවීමක් ලෙස සලකා තිබීමයි. සංචිත; හිමිකමේ කොටසක් බව පැහැදිලි වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 23 සඳහා **නිවැරදි පිළිතුර වූ 3 වන වරණය** තෝරා ගෙන ඇති ප්‍රතිශතය 37%කි. 23%ක් 2 වන වරණය තෝරා ගෙන තිබුණි. 2 වන වරණය තෝරා ගැනීමට හේතුව වී ඇත්තේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී **කාලච්ඡේදයේ ලාභය** යොදා ගත යුතු වුවත් එම අයදුම්කරුවන් යොදා ගෙන ඇත්තේ කාලච්ඡේදයේ ලාභයෙන් ගෙවූ අතුරු ලාභාංශ අඩුකළ පසු ලාභය වීමයි. හිමි-කම මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී, කාලච්ඡේදයේ ලාභය බව තහවුරු වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 08 සඳහා **නිවැරදි පිළිතුර වූ 3 වන වරණය** තෝරා ගෙන ඇති ප්‍රතිශතය 38%කි. 24%ක් 2 වන වරණය ද, 21%ක් 1 වන වරණය ද තෝරා ගෙන තිබුණි. 2 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් හට ද්විත්ව සටහන එකම පැත්තේ සටහන් කර ඇති විට එම වැරැද්ද නිවැරදි කිරීම පිළිබඳ අවබෝධය නොමැති බව හා වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ඇති වී ඇති ශේෂය හරද, බැරද යන්න නිශ්චය කිරීමේ අවබෝධය ද නොමැති බව පෙනී යයි.

1 වන වරණය තෝරාගත් අයම්කරුවන්ට ද ගනුදෙනුවක ද්විත්ව සටහන එකම පැත්තේ සටහන් කර ඇති විට එම වැරැද්ද නිවැරදි කිරීම පිළිබඳ අවබෝධය නොමැති බව පෙනී යයි. නමුත් වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීම පිළිබඳ අවබෝධයක් පවතින බව පෙනී යයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැරදි නිවැරදි කිරීමේ සටහන් හා අවිනිශ්චිත ගිණුම ඉගැන්වීම් තුළ අයදුම්කරුවන් දුර්වල වී ඇති අවස්ථා හඳුනාගෙන ඉගැන්වීම් කටයුතු සංවිධානය කරගත යුතු බව පෙනී යයි.

ප්‍රශ්න අංක 13 සඳහා **නිවැරදි පිළිතුර වූ 2 වන වරණය** තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 38%කි. නමුත් අයදුම්කරුවන්ගෙන් 26%ක් 3 වන වරණය නිවැරදි බව තහවුරු කර ඇත. 3 වන වරණය තෝරාගත් අයදුම්කරුවන් වැරදි වරණයකට යෑමට හේතුව වනුයේ තොගය හා ලාභය අතර සම්බන්ධතාවය දැන සිටිය ද ප්‍රශ්නය තුළින් නිවැරදි දළ ලාභය හා ශුද්ධ ලාභය විමසුව ද ප්‍රශ්නය කියවා තේරුම් ගැනීමේ දුර්වලතාවය මත වැරදි දළ ලාභයක් හා වැරදි ශුද්ධ ලාභයක් ඉදිරිපත් කිරීමයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිසුන් හට ප්‍රශ්න නිසි පරිදි කියවා අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට පුහුණු කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 20 සඳහා **නිවැරදි පිළිතුර වන 5 වන වරණය** තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 41%කි. අයදුම්කරුවන්ගෙන් 22%ක් 1 වන වරණය තෝරා ගෙන තිබුණි.

1 වන වරණය තෝරා ගැනීමට හේතුව වනුයේ LKAS 1ට අනුව මුළු විස්තීරණ ආදායම පිළිබඳ නිර්වචනයේ අවබෝධය නොමැති වීමයි.

LKAS 1හි සංකල්ප රාමුව සිසුන්ට අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය

| ප්‍රශ්න අංකය | ලකුණු ලබාගත් ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලකුණු 0 | ලකුණු 1 | ලකුණු 2 | ලකුණු 3 | ලකුණු 4 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 31 | 13% | 12% | 20% | 32% | 19% | 5% |
| 32 | 1% | 9% | 20% | 43% | 27% | 0% |
| 33 | 2% | 9% | 21% | 25% | 42% | 0% |
| 34 | 29% | 0% | 20% | 0% | 46% | 5% |
| 35 | 22% | 1% | 30% | 1% | 43% | 4% |
| 36 | 8% | 1% | 23% | 0% | 66% | 3% |
| 37 | 35% | 1% | 14% | 1% | 41% | 8% |
| 38 | 7% | 17% | 26% | 25% | 21% | 3% |
| 39 | 1% | 13% | 27% | 39% | 18% | 1% |
| 40 | 47% | 0% | 1% | 0% | 38% | 14% |
| 41 | 57% | 0% | 1% | 0% | 17% | 25% |
| 42 | 63% | 0% | 0% | 0% | 11% | 25% |
| 43 | 37% | 0% | 17% | 1% | 31% | 15% |
| 44 | 5% | 7% | 12% | 35% | 39% | 1% |
| 45 | 3% | 10% | 30% | 30% | 26% | 1% |
| 46 | 11% | 26% | 33% | 17% | 11% | 2% |
| 47 | 44% | 0% | 22% | 0% | 19% | 15% |
| 48 | 34% | 12% | 22% | 5% | 18% | 10% |
| 49 | 46% | 0% | 24% | 0% | 13% | 16% |
| 50 | 56% | 0% | 23% | 0% | 9% | 12% |

වගුව 02

ඉහත වගු අංක 02 මගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරයයි. ඒ අනුව ප්‍රශ්න අංක 41, 42 සහ 56 සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් ප්‍රතිශතය 50% ඉක්මවා ඇත.

ඒ අනුව ගිණුම්කරණ සිද්ධාන්ත පිළිබඳ දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමේ හැකියාව දුර්වල මට්ටමක පවතින අතර එමෙන්ම එම ප්‍රශ්න කියවා නිවැරදි ව තේරුම් ගෙන නොමැති බව පෙන්නුම් කරයි.

ප්‍රශ්න අංක 40, 41 හා 42 යන ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයීම සඳහා අදාළ වනුයේ ගිණුම් කාලච්ඡේදයක් ආරම්භක දින දී නව හවුල්කරුවෙකු බැඳුන හවුල් ව්‍යාපාරයකට සම්බන්ධ තොරතුරු වේ.

මේවායින් ප්‍රශ්න අංක 42 සඳහා අපේක්ෂා කර ඇත්තේ වර්ෂය අවසාන දිනට මුළු හිමිකම පිළිබඳ ව එක් නිශ්චිත පිළිතුරක් පමණක් වන අතර එම පිළිතුර සපයා මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු 4ම ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 11%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 63%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර 25%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන කිළමේ අදාළ ගැලපීම් කර මුළු හිමිකම ලබා ගැනීමේ දුර්වලතාවයක් මෙයින් පෙන්නුම් කරයි.

ප්‍රශ්න අංක 41 ද එක් නිශ්චිත පිළිතුරක් අපේක්ෂිත ප්‍රශ්නයක් වන අතර අයදුම්කරුවන්ගෙන් 57%ක්ම මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. 25%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැති අතර මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු 4 ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 17%ක් පමණි. මෙම ගැටළුවේදී හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කළ යුතු වන්නේ ජංගම ගිණුම තුලිනි. ලාභ විසර්ජනය හා එය ජංගම ගිණුමේ සටහන් වන ආකාරය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනී යයි.

ප්‍රශ්න අංක 40 සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 47%ක් වන අතර 14%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. මෙමගින් පිළිතුර ලෙස අපේක්ෂා කරනුයේ කීර්තිනාමය ගැලපීම පිළිබඳ ව ජර්නල් සටහනක් වන අතර නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 38%ක් පමණි.

හවුල් ව්‍යාපාර සම්බන්ධව සාම්ප්‍රදායික ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් පුරුදු පුහුණු වී ඇති අතර ඒ සම්බන්ධ ගිණුම් තැබීමේ සම්බන්ධතාවයක් හා අන්තර්ගතයක් පිළිබඳ ව අවබෝධය දුර්වල බව පෙනී යයි. ලාභාලාභ විසර්ජන ගිණුම හා ජංගම ගිණුම් අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ අවබෝධය ලැබෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුවේ.

50 වන ප්‍රශ්නය සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 56%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 12%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. මෙමගින් පිළිතුරු ලෙස අපේක්ෂා කරනුයේ ගිණුම්කරණය විෂය නිර්දේශයේ අවසාන නිපුණතාවයක් වන **ප්‍රාග්ධන ආයෝජන තීරණ** පිළිබඳවයි. මේ පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීම මෙයට හේතුව විය හැකිය. ප්‍රමාණවත් අභ්‍යාස ප්‍රමාණයක් යොදා ගෙන මේ පිළිබඳ ව අවබෝධය ලබාදීම වැදගත් වේ.

49 වන ප්‍රශ්නය සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 46%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 16%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. මෙම ප්‍රශ්නය තුළින් අපේක්ෂා කරනුයේ ගිණුම්කරණ විෂය නිර්දේශයේ අවසාන නිපුණතාවයක් වන **පිරිවැය ලාභ පරිමා විශ්ලේෂණය** පිළිබඳවයි. අවසාන මාතෘකා පිළිබඳව සිසුන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බව පිළිතුරු සපයා ඇති ආකාරය තුළින් අවබෝධ වේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී **ස්ථාවර පිරිවැය, විචල්‍ය පිරිවැය** හඳුනාගැනීම හා පිරිවැය ලාභ පරිමා විශ්ලේෂණයට අදාළ සංකල්ප අතර පවතින සම්බන්ධතාවය තහවුරු වන පරිදි අභ්‍යාස කරවීම වඩා උචිත වේ.

47 වන ප්‍රශ්නය සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 44%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 15%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. මෙම ප්‍රශ්නය තුළින් අපේක්ෂා කරනුයේ අයදුම්කරුවන්ගේ ගිණුම්කරණ අනුපාත පිළිබඳ අවබෝධයයි. මෙම ප්‍රශ්නයට සාර්ථක ප්‍රතිචාරයක් නොලැබීමට හේතුව විය හැක්කේ අයදුම්කරුවන් සූත්‍ර කටපාඩම් කිරීමට පෙළඹී ඇති අතර ඒවායේ විචල්‍යයන් අතර පවතින සම්බන්ධතාවය හා භාවිතය, පිළිතුරට ආදේශ කර ගැනීමට නොහැකිවීමයි. ප්‍රමාණවත් අභ්‍යාස සංඛ්‍යාවක් කරවීම තුළින් සිසුන්ට අවබෝධාත්මක දැනුමක් තහවුරු කළ හැකිවේ.

ප්‍රශ්න අංක 43 සඳහා අයදුම්කරුවන්ගෙන් 37%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර 15%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. උපරිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 04ම ලබාගෙන ඇත්තේ 31% පමණි. සමාගම් ගිණුම්කරණයේදී බොහෝ සිසුන් වැඩි අවධානයක් මූල්‍ය ප්‍රකාශනවලට යොමු කරන අතර, මූලික විෂය කොටස් පිළිබඳ අවබෝධය නොසලකා හැරීමක් සිදු වී ඇති බව පෙනී යයි.

ප්‍රශ්න අංක 37 සඳහා අයදුම්කරුවන්ගෙන් 35%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර 8%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. ප්‍රශ්නය තුළ පවතින **පිරිවැය මත දළ ලාභ ආන්තිකය විකුණුම් මිල මත දළ ලාභ ආන්තිකයට** පරිවර්තනය කර ගැනීමේ අපහසුතාවය මෙයට හේතු විය හැක. එහෙත් 41%ක ප්‍රමාණයක් උපරිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 04ම ලබාගෙන ඇත. ප්‍රශ්න නිසි පරිදි කියවා වටිනාකම ලබා දී ඇත්තේ **විකුණුම් මිලට** ද, **පිරිවැයට ද** සහ දළ ලාභ ආන්තිකය දී ඇත්තේ කුමන මිලට ද යන්න අවබෝධ වන අයුරුත් අභ්‍යාස කරවීම වඩා යෝග්‍ය වේ.

ප්‍රශ්න අංක 48 සඳහා අයදුම්කරුවන්ගෙන් 34%ක් ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇති අතර, 10%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. නමුත් ලකුණු 02ක් 22%ක් ද, 18%ක් ලකුණු 04ම ද ලබාගෙන ඇත. ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය පිළිබඳ අවබෝධය මදකමද මූල්‍ය ගිණුම්කරණයේ සහ කළමනාකරණ ගිණුම්කරණයේ **පිරිවැය වර්ගීකරණ** අතර පවතින සම්බන්ධතාවය දුර්වල මට්ටමක පවතින බව ද පෙනී යයි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බව පෙනී යයි.

අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී ඉහත දැක්වූ ආකාරයේ යම් යම් දුර්වලතා පෙන්වූවද 1 වන ප්‍රශ්නය සඳහා 90%ක් ඉතා හොඳින් ප්‍රතිචාර දක්වා තිබුණි. මෙම ප්‍රශ්නය ගිණුම්කරණයේ කාර්යභාරය විමසන ප්‍රශ්නයකි. ප්‍රශ්න අංක 03, 04, 06, 28, 32, 33, 36, 44 සඳහා අයදුම්කරුවන් ප්‍රතිචාර දක්වා තිබුණ ද එම පරාසය 70%-80% දක්වා විය. එම ප්‍රතිචාරය ප්‍රමාණවත් මට්ටමක නොපවතින බව කිව හැක. ගිණුම්කරණ ක්‍රියාවලියේ කාර්යන්හි අනුපිළිවෙළ මූලික පොත් පිළිබඳ දැනුම, ගිණුම්කරණ සංකල්ප, ශ්‍රම පිරිවැය, ගිණුම් වර්ගීකරණය, ලාභ අරමුණු කර නොගත් සංවිධාන පවත්වා ගෙන යන ගිණුම් පිළිබඳ අවබෝධය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ගීකරණය පිළිබඳ දැනුම විමසන ප්‍රශ්නයක් වේ.

ඉහත කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වන්නේ නම් මෙම ප්‍රතිශතය තවදුරටත් ඉහළ නැංවිය හැකි බව කිව හැක.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් යුක්තය. පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි. සෙසු ප්‍රශ්න 5 න් 4 ක් තෝරා ගත යුතු අතර එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 100
II පත්‍රය 100
අවසාන ලකුණු 200 ÷ 2 = 100

* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකම ලකුණු දෙගුණ කර ලබා දෙනු ඇත.
ඒ අනුව අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 200
II පත්‍රය 200
අවසාන ලකුණු 400 ÷ 4 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3 සහ 4, ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

01 ප්‍රශ්නය

**1.** රස කැවිලි අලෙවි කිරීමේ යෙදෙන සීමිත ආලෝක පොදු සමාගමේ 2014.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| 2013.04.01 දිනට තොගය | 1 500 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (වෙළෙඳ ණයගැතියෝ) | 4 000 | |
| බැංකුවේ ඇති මුදල් | 838 | |
| ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් (2014.03.31 දින ආයෝජනය කරන ලද) | 800 | |
| ස්ථාවර තැන්පතුව (වාර්ෂිකව 10% ක පොළියකට වසර දෙකක් සඳහා 2013.10.01 දින ආරම්භ කරන ලද) | 1 600 | |
| කල්බදු පොලී | 960 | |
| ගැනුම් | 7 500 | |
| වැටුප් | 1 200 | |
| සේවක අර්ථසාධක අරමුදල් (EPF) වියදම | 135 | |
| සේවක භාරකාර අරමුදල් (ETF) වියදම | 27 | |
| රක්ෂණ | 840 | |
| මෝටර් රථ ඉන්ධන වියදම | 50 | |
| ප්‍රවර්තන වර්ෂයේ පළමු කාර්තු දෙක සඳහා ගෙවූ බදු | 290 | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 12 000 | |
| 2013.04.01 දිනට අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | | 320 |
| විකුණුම් | | 12 500 |
| ගෙවිය යුතු EPF | | 30 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 9 000 |
| 2013.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 1 040 |
| 2013.04.01 දිනට පොදු සංචිතය | | 1 250 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (වෙළෙඳ ණයහිමියෝ) | | 2 500 |
| 2013.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ මත සමුච්චිත ක්ෂය | | 2 060 |
| කල්බදු ණයහිමියෝ | | 3 040 |
| | **31 740** | **31 740** |

**අතිරේක තොරතුරු:**

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) 2014.03.31 දිනට තොගයේ පිරිවැය රු. 2 000 000 ක් විය. මෙදිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ii) වර්ෂය අවසානයේ දී රු. 400 000 ක් බොල් ණය ලෙස කපා හැරීමටත්, ඉතිරි වෙළෙඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% ක් අඩමාන ණය සඳහා වෙන් කිරීමටත් තීරණය කරන ලදී. සමාගම බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම් සඳහා වෙන් වෙන් ව ගිණුම් පවත්වා ගනී.

(iii) සියලු වත්කම් එක පැකේජයක් ලෙස සලකා 2013.10.01 දින රක්ෂණය කරන ලදී. 2014.09.30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු මුළු වාරිකය ගෙවා ඇති අතර එය වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. රක්ෂණ ගාස්තු පරිපාලන වියදමක් ලෙස සැලකීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(iv) EPF සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වන අතර සේව්‍යා ETF සඳහා 3% ක් දායක වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන මාස 3 සඳහා සමාගම විසින් EPF සහ ETF සඳහා වෙන් කිරීමක් කර නොමැත. නමුත් අවසාන මාස 3 සඳහා සේවකයන්ගේ EPF දායකය අඩු කරගෙන ඇති අතර එය ගෙවිය යුතු EPF ගිණුමට බැර කර ඇත.

(v) ස්ථාවර තැන්පතුව මත ප්‍රවර්තන වර්ෂය සඳහා අදාළ පොලිය මෙතෙක් සටහන් කර නොමැත.

(vi) දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය හා අදාළ අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

(රු.'000)

| වත්කම | පිරිවැය 2014.03.31 දිනට | සමුච්චිත ක්ෂය 2013.04.01 දිනට | ඵලදායී ජීව කාලය (වසර) |
|---|---|---|---|
| ගොඩනැගිල්ල | 6 000 | 1 500 | 20 |
| මෝටර් රථය (2013.04.01 දින මූල්‍ය කල්බද්දක් යටතේ අත්පත් කර ගත්) | 4 000 | - | ? |
| කාර්යාල උපකරණ | 1 200 | 240 | 5 |
| ලී බඩු සහ සවිකිරීම් | 800 | 320 | 5 |
| | 12 000 | 2 060 | |

භාණ්ඩ බෙදාහැරීම සඳහා මෝටර් රථය භාවිත කරන අතර අනිකුත් සියලු ම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කළ යුතු වේ.

(vii) ගොඩනැගිල්ල සහ කාර්යාල උපකරණ ඒවායේ සාධාරණ අගයන් වන රු. 4 800 000 ක් සහ රු. 600 000 ක් ලෙස පිළිවෙළින් ප්‍රථමවරට 2014.03.31 දින ප්‍රත්‍යාගණනය කරන ලදී.

(viii) 2013.04.01 දින මෝටර් රථය වසර 4 ක කාලයක් සඳහා මූල්‍ය කල්බද්දක් යටතේ අත්පත් කර ගන්නා ලදී. මෙම වත්කමේ ඵලදායී ජීව කාලය වසර 6 කි. කල්බදු කාලය අවසානයේ දී වත්කමේ අයිතිය කල්බදු ගැනුම්කරුට මාරු නොවේ. මෙම කල්බදු ගිවිසුම යටතේ රු. 960 000 ක මූලික තැන්පතුවක් ගෙවිය යුතු වේ. තව ද රු. 960 000 ක වාර්ෂික කල්බදු වාරිකයක් 2014.03.31 දිනෙන් ආරම්භ වී සෑම වසරක ම අවසානයේ ගෙවිය යුතු ය. වසර 4 ක කාලය සඳහා කල්බදු පොලී පහත පරිදි වේ:

| වසර | පොලිය (රු.'000) |
|---|---|
| 2013 / 14 | 304 |
| 2014 / 15 | 238 |
| 2015 / 16 | 166 |
| 2016 / 17 | 92 |

ආරම්භක කල්බදු වගකීම සහ මූලික තැන්පතුව නිවැරදි ව ගිණුම්ගත කර ඇත. තව ද ප්‍රවර්තන වර්ෂය සඳහා වාරිකය ගෙවා ඇති අතර එය වර්ෂයේ කල්බදු පොලිය ලෙස සටහන් කර ඇත.

(ix) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද, බදු පෙර ලාභයෙන් 1/3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(x) 2014.03.31 දින සමාගම රඳවාගත් ඉපැයුම්වලින් රු. 1 000 000 ක් පොදු සංචිතයට මාරු කිරීමට තීරණය කර ඇති අතර මෙදින අධ්‍යක්ෂකවරු විසින් රු. 300 000 ක ලාභාංශයක් සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවීමට යෝජනා කර ඇත.

**අවශ්‍යවන්නේ:**

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ආලෝක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය
(2) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
(3) 2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**පිළිතුර**
**ප්‍රශ්න අංක 01**

(1)

සීමිත ආලෝක පොදු සමාගම
2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(රු'000)

| | සටහන් | | | |
|---|---|---|---|---|
| විකුණුම් | | | 12 500 | |
| විකුණුම් පිරිවැය | | | (7 000) | (01) |
| දළ ලාභය | | | 5 500 | |
| වෙනත් ආදායම් | 01 | | 80 | (01) |
| බෙදාහැරීමේ වියදම් | | 1 490 (03) | | |
| පරිපාලන වියදම් | | 2 536 (04) | | |
| වෙනත් වියදම් | | 320 (02) | | |
| මූල්‍ය වියදම් | | 304 (01) | (4 650) | |
| බදු පෙර ලාභය | 02 | | 930 | |
| ආදායම් බදු | | (01) | (310) | |
| කාලච්ඡේදයේ ලාභය | | | 620 | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 600 | (01) |
| මුළු විස්තීරණ ආදායම (01) | | | 1 220 | |

සටහන 01 :- වෙනත් ආදායම් (රු 000)
ස්ථාවර තැන්පතු පොලිය 80

සටහන 02 :-
බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩුකිරීමෙන් පසුවය :

| | (රු'000) |
|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් වියදම (EPF) | 180 |
| සේවක භාරකාර අරමුදල් වියදම (ETF) | 36 |
| ක්ෂය (300 + 1000 + 240 + 160) | 1 700 |
| කල්බදු පොලී | 304 |
| තොග කපා හැරීම | 200 |
| කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන අලාභය | 120 |

(02)

**(ලකුණු 18)**

**පෙර වැඩ :**

**විකුණුම් පිරිවැය** (රු'000)

| | |
|---|---|
| 2013.04.01 තොගය | 400 |
| ගැනුම් | 1 500 |
| 2014.03.31 තොගය | (2 000) (01) |
| | 7 000 |

**බෙදාහැරීමේ වියදම් (රු'000)**

| | |
|---|---|
| බොල්ණය | 400 (01) |
| අඩමාන ණය වෙන්කිරීම | 40 (01) |
| මෝටර් රථ ක්ෂය | 1 000 (01) |
| ඉන්ධන වියදම | 50 |
| | 1 490 |

**පරිපාලන වියදම් (රු'000)**

| | |
|---|---|
| රක්ෂණ ගාස්තු | 420 |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම | 180 |
| සේවක භාරකාර අරමුදල් වියදම | 36 |
| වැටුප් | 1 200 |
| ගොඩනැගිලි ක්ෂය | 300 |
| කාර්යාල උපකරණ ක්ෂය | 240 |
| ලී බඩු හා සවිකිරීම් ක්ෂය | 160 |
| | 2 536 |

**අයිතම 2කට 1 බැගින් අයිතම 7ට ලකුණු (04)**

**වෙනත් වියදම් (රු'000)**

| | |
|---|---|
| තොග කපා හැරීම | 200 (01) |
| කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන | 120 (01) |
| අලාභය | |
| | 320 |

**මූල්‍ය වියදම් (රු'000)**

| | |
|---|---|
| කල්බඳු පොලී | 304 (01) |

(2)

සීමිත ආලෝක පොදු සමාගම
2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(රු'000)

| | ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| 2013.04.01 ශේෂය | 9 000 | - | 1 250 | 1 040 | 11 290 |
| මුළු විස්තීරණ ආදායම | - | (01) 600 | - | (01) 620 | 1 220 |
| පොදු සංචිතයට මාරු කිරීම | - | - | 1 000 | (1 000) (01) | - |
| 2014.03.31 ශේෂය | 9 000 | 600 | 2 250 | 660 | 12 510 |

**(ලකුණු 03)**

(3) සීමිත ආලෝක පොදු සමාගම

2014.03.31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | සටහන් | රු'000 | රු'000 |
| දේපල, පිරියත හා උපකරණ | 03 | (01) | 8 720 |
| ස්ථාවර තැන්පතුව | | | 1 600 |
| | | | 10 320 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 1 800 (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 3 240 (01) | |
| ඉදිරියට ගෙවූ රක්‍ෂණ ගාස්තු | | 420 (01) | |
| ලැබිය යුතු පොලී | | 80 (01) | |
| මුදල් හා මුදල් සමාන දෑ | 04 | 1 638 (01) | 7 178 |
| **මුළු වත්කම්** | | | 17 498 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | | | 9 000 (01) |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 600 | |
| පොදු සංචිතය | (01) | 2 250 | |
| රඳවාගත් ඉපැයුම් | | 660 | 3 510 |
| | | | 12 510 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ | | | 1 662 (01) |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 2 500 | |
| උපචිත සේවක අර්ථසාධක අරමුදල් | | 75 (01) | |
| උපචිත සේවක භාරකාර අරමුදල් | | 9 | |
| කල්බදු ණය හිමියෝ | | 722 (01) | |
| ආදායම් බදු සඳහා වෙන්කිරීම | | (01) 20 | 3 326 |
| | | | 17 498 |

සටහන 03 - දේපල, පිරියත සහ උපකරණ

(රු'000)

| | ගොඩනැගිලි | මෝටර් රථ | කාර්යාල උපකරණ | ලීබඩු හා සවිකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2013.04.01 ශේෂය | 6 000 | - | 1 200 | 800 | 8 000 |
| ප්‍රත්‍යාගණනය (01) | 600 | | (120) | | 480 |
| ප්‍රත්‍යාගණන මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | (1 800) | | (480) | | (2 280) |
| අත්පත් කර ගැනීම් | | 4 000 (01) | | | 4 000 |
| 2014.03.31 ශේෂය | 4 800 | 4 000 | 600 | 800 | 10 200 |
| **ක්ෂය වෙන්කිරීම්** | | | | | |
| 2013.04.01 ශේෂය | 1 500 | - | 240 | 320 | 2 060 |
| වර්ෂයේ ක්ෂය (02) | 300 | 1 000 | 240 | 160 | 1 700 |
| ප්‍රත්‍යාගණන මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | (01) (1 800) | | (480) | | (2 280) |
| 2014.03.31 ශේෂය | - | 1 000 | - | 480 | 1 480 |
| 2013.03.31 දිනට ධාරණ වටිනාකම | 4 800 | 3 000 | 600 | 320 | 8 720 |

වර්ෂය තුළ ගොඩනැගිලි රු. 4 800 000කට සහ කාර්යාල උපකරණ රු. 600 000කට ප්‍රත්‍යාගණනය කර ඇත. ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් රු. 600 000ක අතිරික්තයක් ද කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනයෙන් රු. 120 000ක ඌණතාවයක් ද ඇති විය.

**සටහන 04 -** මුදල් හා මුදල් සමාන දෑ (රු'000)

| | |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 800 |
| බැංකුවේ ඇති මුදල් | 838 |
| | 1 638 |

**සටහන 05 -** රු. 300 000 ලාභාංශයක් සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවීමට අධ්‍යක්ෂකවරුන් විසින් යෝජනා කර ඇත. (01)

**(ලකුණු 19)**

**(මුළු ලකුණු 40)**

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.

1 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 8%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 8%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 39%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර අනු කොටස් තුනේම පහසුතාව 35%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (3) වී ඇති අතර, එහි පහසුතාව 38%කි. වැඩිම පහසුතාව සහිත අනුකොටස (2) වී ඇති අතර, එහි පහසුතාවය 43%කි.

(2) වන කොටසේ පහසුතාව 43%ක් වන අතර ඊට හේතු ලෙස මුළු විස්තීරණ ආදායම තනි ප්‍රකාශනයකින් ප්‍රත්‍යාගණන සංචිතයට හා රඳවාගත් ඉපැයුම් තීරුවලට ගෙන නොතිබීමයි. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ අවබෝධය පහළ මට්ටමක පවතින බැවින් එම ප්‍රමිත පිළිබඳ අවබෝධය තහවුරු වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුවේ.

(3) වන කොටසේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු ප්‍රමිතය (LKAS 17) පිළිබඳ අවබෝධය හා දේපල පිරියත හා උපකරණ (LKAS 16) ප්‍රමිතය පිළිබඳ අවබෝධය අඩු බැවින් කල්බදු දේපල ක්ෂය සහ ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණි. මෙම ප්‍රමිතයන් පිළිබඳ දැනුම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ලබාදිය යුතුවේ.

## 02 ප්‍රශ්නය

**2.** **(අ) 2013.03.31 දිනට නුවන්, විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.**

| | |
|---|---|
| | **රු.'000** |
| **වත්කම්** | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකමට | 6000 |
| තොගය | 1 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (වෙළෙඳ ණයගැතියෝ) | 1 500 |
| බැංකුවේ ඇති මුදල් | 500 |
| | **9 000** |
| **හිමිකම් සහ වගකීම්** | |
| *ප්‍රාග්ධන ගිණුම්:* | |
| නුවන් | 3 000 |
| විශ්ව | 3 000 |
| සඳුන් | 2 000 |
| *ජංගම ගිණුම්:* | |
| නුවන් | 350 |
| විශ්ව | 330 |
| සඳුන් | 80 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (වෙළෙඳ ණයහිමියෝ) | 240 |
| | **9 000** |

**අතිරේක තොරතුරු:**

(i) නුවන්, විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි විය.

- නුවන්, විශ්ව සහ සඳුන් පිළිවෙළින් ලාභඅලාභ 3:2:1 අනුපාතයට බෙදා ගැණුනි.
- සෑම හවුල්කරුවකු සඳහා ම මාසික ව රු. 10 000 ක වේතනයක් හිමි විය.
- හවුල්කරුවන්ට ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය මත 5% ක පොලියක් හිමි විය.

(ii) 2013.04.01 දින හවුල් ව්‍යාපාරයෙන් නුවන් විශ්‍රාම ගත්තේ ය. ඔහුට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමටත්, ඒ සඳහා වාර්ෂික ව 10% ක පොලියක් ගෙවීමටත් එකඟ විය. ප්‍රවර්තන වර්ෂය සඳහා පොලිය ගෙවිය යුතු වේ.

(iii) 2013.04.01 දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 900 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාමය වත්කමක් ලෙස පොත්වල හඳුනා නොගන්නා අතර ඒ සඳහා සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් කළ යුතු වේ.

(iv) 2013.04.01 දින විශ්ව සහ සඳුන් පිළිවෙළින් ලාභඅලාභ 2:1 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය. වේතන සහ ප්‍රාග්ධන පොලී සම්බන්ධ කොන්දේසි නොවෙනස් ව පවතී.

(v) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ ගනුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ:

| තොරතුරු | රු.'000 |
|---|---|
| විකුණුම් (මෙයින් 60% ක් ණය පදනම මත වේ) | 6 000 |
| ණයගැතියන්ගේ ලැබීම් | 2 500 |
| ගැනුම් (මෙයින් 80% ක් ණය පදනම මත වේ) | 3 000 |
| ණයහිමියන්ට ගෙවීම් | 1 240 |
| මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් | 520 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | 1 000 |
| ගැනිලි (හවුල්කරුවකුට රු. 60 000 බැගින්) | 120 |

(vi) 2014.03.31 දිනට තොගය රු. 750 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට විසර්ජනයන් ද ඇතුළු ව)

(2) වෙළෙඳ ලැබිය යුතු දෑ, වගකීම් සහ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ දක්වමින් 2014.03.31 දිනට විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්

(ආ) සීමිත රොෂාන් පොදු සමාගම, පාන් වර්ග දෙකක් (වර්ග 1 සහ වර්ග 2) නිෂ්පාදනය කරයි. එයට නිෂ්පාදන දෙපාර්තමේන්තු තුනකින් (යන්ත්‍ර, එකලස් සහ නිමැවුම්) සමන්විත කර්මාන්තශාලාවක් සහ ගබඩාවක් ඇති අතර ඒවා වෙන් වෙන් ගොඩනැගිලිවල පිහිටා ඇත. 2015 වර්ෂය සඳහා අයවැයගත පොදු කාර්ය පිරිවැය පහත පරිදි වේ.

| පොදු කාර්ය පිරිවැය | රු.'000 |
|---|---|
| *වක්‍ර වැටුප්:* | |
| යන්ත්‍ර දෙපාර්තමේන්තුව | 310 |
| එකලස් දෙපාර්තමේන්තුව | 630 |
| නිමැවුම් දෙපාර්තමේන්තුව | 140 |
| ගබඩාව | 180 |
| *කුලිය:* | |
| කර්මාන්තශාලාව | 1 600 |
| ගබඩාව | 400 |
| *ආලෝකය:* | |
| කර්මාන්තශාලාව | 600 |
| ගබඩාව | 140 |
| යන්ත්‍ර දෙපාර්තමේන්තුව සඳහා තෙල් | 300 |
| යන්ත්‍ර ක්ෂය | 1 200 |
| රක්ෂණ - ගබඩාව | 500 |
| ආරක්ෂක ගාස්තු | 300 |

**අතිරේක තොරතුරු:**

(i)

| අයිතමය | යන්ත්‍ර | එකලස් | නිමැවුම් | ගබඩාව |
|---|---|---|---|---|
| ආරක්ෂක සේවකයන් ගණන | 10 | 12 | 6 | 2 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර) | 3 600 | 2 800 | 1 600 | 200 |
| යන්ත්‍ර පිරිවැය (රු.'000) | 500 | 600 | 200 | 200 |
| සෘජු ශ්‍රම පැය ගණන | 200 | 484 | 270 | - |
| යන්ත්‍ර පැය ගණන | 400 | 70 | 180 | - |
| ගබඩා අධියාචනා පත්‍ර ගණන | 25 | 15 | 10 | - |

(ii) යන්ත්‍ර දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතත්, අනිකුත් නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සෘජු ශ්‍රම පැය මතත් පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබයි.

(iii) පැනක් නිෂ්පාදනය සඳහා අයවැයගත පැය:

| දෙපාර්තමේන්තුව | වර්ග 1 | වර්ග 2 |
|---|---|---|
| යන්ත්‍ර | 4 | 3 |
| එකලස් | 3 | 5 |
| නිමැවුම් | 2 | 4 |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ගබඩාවේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනය ද සමඟ)

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) එක් එක් පෑන් වර්ගයට අන්තර්ග්‍රහණය කරන ලද පොදු කාර්ය පිරිවැය

## පිළිතුර

**ප්‍රශ්න අංක 02**

(අ) (1)

විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරය
2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

(රු'000)

| | | |
|---|---|---|
| විකුණුම් | | (01) 6 000 |
| විකුණුම් පිරිවැය : | | |
| තොගය | 1 000 | |
| ගැණුම් | 3 000 (01) | |
| තොගය | (750) | (3 250) |
| දළ ලාභය | | (01) 2 750 |
| මෙහෙයුම් වියදම් | 520 | |
| ක්ෂය | 1 000 (01) | |
| ණය පොලී | 380 (01) | (1 900) |
| කාලච්ඡේදයේ ලාභය | | (01) 850 |
| ප්‍රාග්ධන පොලී - විශ්ව | 150 } (01) | |
| සඳුන් | 100 } | (250) |
| වේතන - විශ්ව | 120 } (01) | |
| සඳුන් | 120 } | (240) |
| ලාභ කොටස් - විශ්ව | (01) { 240 | |
| සඳුන් | 120 | (360) |

**(ලකුණු 09)**

(2) විශ්ව සහ සඳුන් හවුල් ව්‍යාපාරය
2014.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්

(රු'000)

| | | |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 2 600 (01) |
| **හිමිකම් හා වගකීම්** | | |
| ප්‍රාග්ධන ගිණුම් - විශ්ව | 2 700 (01) | |
| සඳුන් | 1 850 (01) | 4 550 |
| ජංගම ගිණුම් - විශ්ව | 780 (02) | |
| සඳුන් | 360 (02) | 1 140 |
| **ජංගම නොවන වගකීම්** | | |
| නුවන්ගේ ණය මුදල | | 3 800 (02) |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1 400 (01) | |
| උපචිත ණය පොලී | (01) 380 | 1 780 |

**(ලකුණු 11)**

**පෙර වැඩ :**

ප්‍රාග්ධන ගිණුම්

(රු'000)

| | නුවන් | විශ්ව | සඳුන් | | නුවන් | විශ්ව | සඳුන් |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | - | 600 | 300 | ශේෂය ඉ/ගෙ | 3 000 | 3 000 | 2 000 |
| ණය ගිණුම - නුවන් | 3 800 | - | (01) | කීර්තිනාමය | 450 | 300 | 150 |
| ශේෂය ප/ගෙ | - | 2 700 | 1 850 | ජංගම ගිණුම-නුවන් | 350 | (01) | - |
| | 3 800 | 3 300 | 2 150 | | 3 800 | 3 300 | 2 150 |

ජංගම ගිණුම්

(රු'000)

| | නුවන් | විශ්ව | සඳුන් | | නුවන් | විශ්ව | සඳුන් |
|---|---|---|---|---|---|---|---|
| ගැනිලි | - | 60 | 60 | ශේෂය ඉ/ගෙ | 350 | 330 | 80 |
| ප්‍රාග්ධන ගිණුම - නුවන් | 350 | | (01) | ප්‍රාග්ධන පොලී | (01) | 150 | 100 |
| ශේෂය ප/ගෙ | - | 780 | 360 | වේතන | (01) | 120 | 120 |
| | | | | ලාභ කොටස් | (01) | 240 | 120 |
| | 350 | 840 | 420 | | 350 | 840 | 420 |

ණයහිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 240 | ශේෂය ඉ/ගෙ | 240 |
| ශේෂය ප/ගෙ | 1 400 | ගැනුම් | 2 400 (01) |
| | 2 640 | | 2 640 |

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 1 500 | මුදල් | 2 500 |
| විකුණුම් | 3 600 (01) | ශේෂය ප/ගෙ | 2 600 |
| | 5 100 | | 5 100 |

(ආ) (1)

## සීමිත රොෂාන් පොදු සමාගම
## පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(රු'000)

| අයිතමය | විභාජන පදනම | එකතුව | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | | සේවා දෙපාර්තමේන්තු |
|---|---|---|---|---|---|---|
| | | | යන්ත්‍ර | එකලස් | නිමැවුම් | ගබඩා |
| වක්‍ර වැටුප් | සෘජු | 1 260 | 310 | 630 | 140 | 180 (01) |
| ගබඩා කුලී | සෘජු | 400 | | | | 400 |
| ආලෝකය - ගබඩාව | සෘජු | 140 | | | | 140 (02) |
| යන්ත්‍ර සඳහා තෙල් | සෘජු | 300 | 300 | | | |
| රක්ෂණ - ගබඩාව | සෘජු | 500 | | | | 500 |
| කුලිය - කර්මාන්ත ශාලාව | බිම් ප්‍රමාණය (වර්ග මීටර) (01) (9 : 7 : 4) | 1 600 | 720 | 560 | 320 | (01) |
| ආලෝකය - කර්මාන්ත ශාලාව | බිම් ප්‍රමාණය (වර්ග මීටර) (01) (9 : 7 : 4) | 600 | 270 | 210 | 120 | (01) |
| යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය (01) (5 : 6 : 2 : 2) | 1 200 | 400 | 480 | 160 | 160 (01) |
| ආරක්ෂක ගාස්තු | ආරක්ෂක සේවක ගණන (01) (5 : 6 : 3 : 1) | 300 | 100 | 120 | 60 | 20 (01) |
| | | 6 300 | 2 100 | 2 000 | 800 | 1 400 |
| ගබඩා පොදු කාර්ය පිරිවැය | ගබඩා අධියාචනාපත් ගණන (01) (5 : 3 : 2) | | (01) 700 | 420 | 280 | (1 400) |
| | | 6 300 | 2 800 | 2 420 | 1 080 | - |

**(ලකුණු 13)**

(රු'000)

| (2) | යන්ත්‍ර | එකලස් | නිමැවුම් |
|---|---|---|---|
| පොදු කාර්ය පිරිවැය | යන්ත්‍ර පැයකට | ශ්‍රම පැයකට | ශ්‍රම පැයකට |
| අන්තර්ග්‍රහණ අනුපාතය : | රු. 7 (01) | රු. 5 (01) | රු. 4 (01) |

**පෙර වැඩ :**

| | | |
|---|---|---|
| 2 800 / 400 (01) | 2 420 / 484 (01) | 1 080 / 270 (01) |
| රු. 7 | රු. 5 | රු. 4 |

**(ලකුණු 03)**

(3)

| වර්ග 1 (රු'000) | වර්ග 2 (රු'000) |
|---|---|
| 51 (02) | 62 (02) |

**පෙර වැඩ :**

| වර්ග 1 (රු'000) | | | වර්ග 2 (රු'000) | | |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර | 4 x 7 | 28 | යන්ත්‍ර | 3 x 7 | 21 |
| එකලස් | 3 x 5 | 15 | එකලස් | 5 x 5 | 25 |
| නිමැවුම් | 2 x 4 | 8 | නිමැවුම් | 4 x 4 | 16 |
| | (02) | 51 | | (02) | 62 |

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 40)**

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
2 ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවද ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 97%ක් පමණි.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වඩා ලකුණු ලබාගත් පිරිස අයදුම්කරුවන්ගෙන් 21%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 29%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙනි.




අනුකොටස් 5කින් යුත් මෙම ප්‍රශ්නයේ සෑම කොටසකම පහසුතාව 33% කට වඩා ඉහළය. පහසුතාව වැඩිම අනුකොටස (අ) (1) වන අතර එහි පහසුතාවය 61%කි. පහසුතාව අඩුම අනුකොටස (ආ) 3 වේ. එහි පහසුතාව 33%කි.

2 වන ප්‍රශ්නයේ (අ) (1) කොටසේ පහසුතාව 61%කි. ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම තුළින් වසරේ ගැනුම් හා විකුණුම් නිවැරදි ව ගණනය කිරීමට නොහැකිවීම, හවුල්කරුවකු වූ නුවන් විශ්‍රාම යෑම නිසා ඔහුට ගෙවිය යුතු හිමිකම ණය ගිණුමකට මාරු කළ ද ඒ සඳහා ගෙවියුතුව තිබූ 10% පොලිය ගලපා නොතිබීම යන දුර්වලතා සිදුවී තිබුණි.

(අ) 2 කොටසේ පහසුතාව 55%කි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළෙඳ ගෙවිය යුතු දෑ නිවැරදි ව ගණනය කර නොතිබීම, නුවන්ගේ ණය ගිණුමේ ශේෂය නිවැරදිව ගණනය කර නොතිබීම හා එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ ඇතුළත් කර නොතිබීම යන පොදු දුර්වලතා අයදුම්කරුවන් විසින් සිදුකර තිබුණි.

හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී හවුල්කරුවෙකු විශ්‍රාම යන විට ඔහුගේ හිමිකම ණය ගිණුමට මාරුකිරීම හා පොලිය ගැලපීම යන කරුණු අවබෝධ වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

(ආ) 1 කොටසේ පහසුතාව 55%කි. පොදු කාර්ය පිරිවැය නිවැරදි පදනම මත පිරිවැය මධ්‍යස්ථාන අතර විභජනය කිරීම පිළිබඳ අවබෝධය සමහර සිසුන්ට නොතිබුණි.

2 කොටසේ පහසුතාව 50%කි. නිෂ්පාදන මධ්‍යස්ථානවල පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

3 වන කොටසේ පහසුතාව 33%කි. වර්ග 1 හා වර්ග 2 භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට, පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කර නොතිබීම, ගණනය කරන ලද අන්තර්ග්‍රහණ අනුපාතය නිවැරදි පැය ගණනට අනුකූලව ගණනය කර නොතිබීම යන දුර්වලතා දක්නට ලැබුණි.

සේවා දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය සෘජුවම බෙදා වෙන් කර දී තිබුණ ද ඒ පිළිබඳ සිසුන් දැනුවත් වී නොතිබුණි. පොදුකාර්ය පිරිවැය මධ්‍යස්ථාන අතර නිවැරදි ව විභජනය, නැවත විභජනය, අන්තර්ග්‍රහණ අනුපාත සැකසීම, අනුපාත ඔස්සේ අන්තර්ග්‍රහණය අවබෝධය තහවුරු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

03 ප්‍රශ්නය

**3. 2014.01.01 දින රු. 400 000 ක පෞද්ගලික ඉතුරුම් ආයෝජනය කරමින් එරංග ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. රු. 120 000 කට තක්සේරු කරන ලද ඔහුගේ පරිගණකය ද ව්‍යාපාරය සඳහා යොදා ගන්නා ලදී. 2014 ජනවාරි මාසය තුළ සිදු වූ ව්‍යාපාරයේ සමහර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පහත පරිදි සටහන් කර ඇත.**

**(සියලු වටිනාකම් රු. '000 වලිනි.)**

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | හිමිකම් |
|---|---|---|---|---|---|---|
| | ලී බඩු | තොග | ණයගැතියෝ | බැංකු | | |
| 1 | | + 200 | | − 200 | | |
| 2 | | + 180 | | | + 180 | |
| 3 | + 180 | | | − 180 | | |
| 4 | | − 40 | | + 50 | | + 10 |
| 5 | | | | − 38 | − 40 | + 2 |
| 6 | | − 60 | + 100 | | | + 40 |
| 7 | | | − 60 | + 57 | | − 3 |
| 8 | | | | − 8 | | − 8 |

**අතිරේක තොරතුරු:**

(i) ව්‍යාපාරයේ සියලු ම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබේ.

(ii) 2014.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවීය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දැ පොත්වල සටහන් කර නොමැති බව අනාවරණය විය:
- එරංගගේ දියණියගේ පාසල් ගාස්තු ගෙවීමට නිකුත් කළ රු. 10 000 ක චෙක්පතක් (එරංග මෙම මුදල පමණක් මාසය තුළ දී ලබාගෙන ඇත.)
- ව්‍යාපාරයේ දුරකථන ගාස්තු සඳහා ස්ථාවර නියෝග ගෙවීම් රු. 2 000
- ණයගැතියකු විසින් බැංකුවේ සෘජුව ම තැන්පත් කරන ලද රු. 30 000 ක චෙක්පතක්

(iii) ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු වේ. මෙම වත්කම් මාසය මුල සිටම භාවිතය සඳහා පැවතුනි.

(iv) 2014 ජනවාරි මාසය සඳහා නගර සභාවට ගෙවිය යුතු වරිපණම් රු. 5 000 කි.

**අවශ්‍යවන්නේ:**

(1) ගනුදෙනු අංක 1 සිට 8 දක්වා විස්තර කිරීම

(2) ශුද්ධ වත්කම් පදනම මත 2014 ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය

(3) 2014.01.31 දිනට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කළ යුතු තොග, ණයගැති සහ බැං ශේෂයන්

පිළිතුර

**ප්‍රශ්න අංක 03**

(1)
(1) රු. 200 000ක් වටිනා භාණ්ඩ අත්පිට මිලට ගැනීම. (01)
(2) රු. 180 000ක් වටිනා භාණ්ඩ ණයට මිලට ගැනීම. (01)
(3) රු. 180 000කට ලී බඩු අත්පිට මිලට ගැනීම. (01)
(4) රු. 40 000ක් පිරිවැය වූ භාණ්ඩ රු. 50 000කට අත්පිට විකිණීම. (02)
(5) රු. 40 000ක ණයහිමියන්ට රු. 38 000ක් ගෙවා රු. 2 000ක වට්ටමක් ලබාගැනීම. (02)
(6) රු. 60 000ක් පිරිවැය වූ භාණ්ඩ රු. 100 000කට ණයට විකිණීම. (02)
(7) රු. 60 000ක ශේෂයක් සතු ණයගැතියෙකුගෙන් රු. 3 000ක වට්ටමකට යටත්ව රු. 57 000ක් ලැබීම. (02)
(8) රු. 8 000ක වියදමක් මුදලින් ගෙවීම. (01)

**(ලකුණු 12)**

(2) ලාභය/(අලාභය) = අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි

රු. 31 500 = 541 500 (05) - 520 000 (02) + 10 000 (01)

**(ලකුණු 08)**

**පෙර වැඩ :**

| | රු | |
|---|---|---|
| **ආරම්භක ශුද්ධ වත්කම්** | | |
| මුදල් | 400 000 | (01) |
| පරිගණකය | 120 000 | (01) |
| | 520 000 | |
| **අවසාන ශුද්ධ වත්කම්** | | |
| ආරම්භක ශුද්ධ වත්කම් | 520 000 | |
| ගනුදෙනු අංක 1 සිට 8න් (10 000+2 000+40 000-3 000-8 000) | 41 000 | (02) |
| දුරකතන ගාස්තු | (2 000) | (01) |
| ක්ෂය | (2 500) | (01) |
| වරිපනම් | (5 000) | (01) |
| ගැනිලි | (10 000) | |
| | 541 500 | |

(3)
තොගය රු. 280 000 (02)
ණයගැතියෝ රු. 10 000 (02)
බැංකු ශේෂය රු. 99 000 (06)

**(ලකුණු 10)**

**පෙර වැඩ :**

| | රු | |
|---|---|---|
| **ණයගැතියෝ** | | |
| අංක 1 සිට 8 දක්වා ගනුදෙනුවලින් | 40 000 | (01) |
| බැංකුවේ ඍජුව තැන්පත් කළ චෙක්පත | (30 000) | (01) |
| | 10 000 | |

| බැංකු ශේෂය | රු | |
|---|---|---|
| ප්‍රාග්ධනය ලෙස යෙදවූ මුදල | 400 000 | (02) |
| අංක 01 සිට 8 දක්වා ගනුදෙනුවලින් | (319 000) | (01) |
| ගැනිලි | (10 000) | (01) |
| දුරකථන ගාස්තු | (2 000) | (01) |
| ණයගැතියෙකු සෘජුව තැන්පත් කළ චෙක්පත | 30 000 | (01) |
| | 99 000 | |

**(මුළු ලකුණු 30)**

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
3 ප්‍රශ්නය අයදුම්කරුවන්ගෙන් 93%ක් පමණ තෝරා ගෙන ඇත.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලකුණු ලබාගත් පිරිස 17%ක් වන අතර ලකුණු 7 හෝ ඊට අඩුවෙන් ලබාගත් සිසුන් පිරිස අයදුම්කරුවන්ගෙන් 10%කි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (1) වන අතර එහි පහසුතාව 78%කි. එසේම පහසුතාවය අඩුම කොටස (2) වන අතර එහි පහසුතාවය 24% කි.

(3) (1) වන කොටසේ පහසුතාව 78%කි. ණය හිමියන්ට මුදල් ගෙවීමේදී හා ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේදී "වට්ටම", වගකීම් අඩුවීමක් හා වත්කම් අඩුවීමක් ලෙස සමහර අයදුම්කරුවන් හඳුනා ගෙන නොතිබුණි. එසේම ගනුදෙනු විස්තර කිරීමේදී වටිනාකම් රහිතව සඳහන් කර තිබුණි.

(3) (2) වන කොටසේ පහසුතාව 24%කි. ආරම්භක ශුද්ධ වත්කම් ගණනයේදී පරිගණකයේ වටිනාකම බොහෝ සිසුන් සැලකිල්ලට ගෙන නොතිබුණි. අතිරේක තොරතුරු ඇසුරෙන් අවසාන ශුද්ධ වත්කම් නිවැරදි ව ගණනය කිරීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි.

(3) (3) වන කොටසේ පහසුතාව 49%කි. අතිරේක තොරතුරු භාවිත කර ණයගැති හා බැංකු ශේෂය ගණනය කිරීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි.

ගනුදෙනු විස්තර කිරීමේදී වටිනාකම් සහිතව විස්තර කිරීමටත්, අතිරේක තොරතුරු ඇසුරෙන් අවසාන ශේෂ ගණනය කිරීමටත්, ඒ ඇසුරෙන් අවසාන ශුද්ධ වත්කම් නිවැරදි ව ගණනය කිරීමත් පිළිබඳ ව අවබෝධ වනසේ විවිධ අභ්‍යාස කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

04 ප්‍රශ්නය

**4.** **(අ)** සීමිත නාදන් ටයර් නිෂ්පාදන පොදු සමාගමේ 2014 මාර්තු මාසය සඳහා වැටුප් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

(සියලු වටිනාකම් රු.'000 වලිනි.)

| | **සේවක වර්ගය:** | | | |
|---|---|---|---|---|
| **විස්තරය** | **නිෂ්පාදන සේවකයන්** | **නිෂ්පාදන සුපරීක්ෂකවරුන්** | **නිෂ්පාදන කළමනාකරු** | **පරිපාලන සහයකයන්** |
| මූලික වැටුප | 5000 | 3000 | 1500 | 500 |
| දිරි දීමනා (කැලි අනුපාතයට පදනම් ව) | 2500 | - | - | - |
| අතිකාල දීමනා | - | 500 | 250 | - |
| ගමන් දීමනා | - | 250 | 150 | - |
| ප්‍රසාද දීමනා (සමාගමේ ලාභ පදනම් ව) | 250 | 150 | 75 | 25 |
| **දළ වැටුප** | **7 750** | **3 900** | **1 975** | **525** |
| *අඩු කිරීම්:* | | | | |
| සේවක ණය ආපසු අය කිරීම් | 300 | 100 | - | - |
| EPF දායකය (10%) | 500 | 300 | 150 | 50 |
| **ශුද්ධ වැටුප** | **6 950** | **3 500** | **1 825** | **475** |
| *සමාගමේ දායකත්වයන්:* | | | | |
| EPF (15%) | 750 | 450 | 225 | 75 |
| ETF (3%) | 150 | 90 | 45 | 15 |

**අතිරේක තොරතුරු:**

දිරි දීමනාව විශේෂ ටයර් වර්ගයක් නිෂ්පාදනය කිරීම සඳහා ලද ඇණවුමක් සම්පූර්ණ කිරීම හා බැඳේ.

**අවශ්‍යවන්නේ:**

2014.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත දෑ : (එක් එක් අයිතමයේ සංයුතිය වෙන් වෙන් ව දක්වමින්).

(1) ඍජු වේතන

(2) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ අන්තර්ගත සේවකයන්ට අදාළ වියදම්

(3) සේවකයන්ට අදාළ මුළු වියදම්

**(ආ)** 2014.03.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සීමිත අමීන් පොදු සමාගමට පහත සඳහන් තොරතුරු අදාළ වේ.

*ණයගැති ලෙජරයේ සාරාංශය:*

(සියලු වටිනාකම් රු.'000 වලිනි.)

| **ණයගැතියා** | **විකුණුම්** | **දුන් වට්ටම්** | **මුදල් ලැබීම්** | **2014.03.31 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| අමල් | 1600 | 160 | 660 | 780 |
| කමල් | 900 | 90 | 590 | 220 |
| සුමල් | 500 | - | - | 500 |
| **එකතුව** | **3 000** | **250** | **1 250** | **1 500** |

*ණයහිමි ලෙජරයේ සාරාංශය:*

(සියලු වටිනාකම් රු.'000 වලිනි.)

| **ණයහිමියා** | **ගැනුම්** | **ලද වට්ටම්** | **මුදල් ගෙවීම්** | **2014.03.31 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| සාමා | 1 200 | 120 | 530 | 550 |
| මාලා | 800 | 80 | 650 | 70 |
| ප්‍රියංකා | 400 | - | - | 400 |
| **එකතුව** | **2 400** | **200** | **1 180** | **1 020** |

**අතිරේක තොරතුරු:**

(i) 2014.03.31 දිනට ණයගැති ලෙජරයේ සහ ණයහිමි ලෙජරයේ ශේෂවල එකතුන් එදිනට අදාළ පාලන ගිණුම්වල ශේෂ සමඟ එකඟ නොවීය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ අනාවරණය විය.

- විකුණුම් ජර්නලයේ එකතුව ණයගැති පාලන ගිණුමට සහ විකුණුම් ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 300 000 ක් ලෙස ය.
- ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමට හර කර ඇත. නමුත් එය නිවැරදි ව දුන් වට්ටම් ගිණුමේ සටහන් කර ඇත.
- ගැනුම් ජර්නලයේ එකතුව ණයහිමි පාලන ගිණුමට හා ගැනුම් ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 4 200 000 ක් ලෙස ය.
- ප්‍රියංකාට ආපසු යැවුම් රු. 20 000 ක් ණයහිමි ලෙජරයේ ඇයගේ ගිණුමේ සටහන් කර නොමැත. එය පොදු ලෙජරයේ ණයහිමි පාලන ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත.

(ii) 2014.03.31 දිනෙන් අවසන් මාසය සඳහා (ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර) සමාගමේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ වාර්තා කළ අලාභය රු. 2 000 000 කි.

**අවශ්‍යවන්නේ:**

(1) වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් (*සංලක්ෂ්‍යය අවශ්‍ය වේ.*)
(2) 2014.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සංශෝධිත ලාභය හෝ අලාභය
(3) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර 2014 මාර්තු මාසය සඳහා ණයගැති පාලන ගිණුම
(4) ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු 2014 මාර්තු මාසය සඳහා ණයහිමි පාලන ගිණුම

## පිළිතුර

**ප්‍රශ්න අංක 04**

04. (අ)

රු'000

| විස්තරය | (1)<br>සෘජු වේතන | (2)<br>නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ අන්තර්ගත වියදම | (3)<br>සේවක මුළු වියදම් |
|---|---|---|---|
| මූලික වැටුප | 5 000 | 4 500 (01) | 10 000 |
| දිරි දීමනා | 2 500 | - | 2 500 |
| අතිකාල දීමනා | - | 750 (01) | 750 |
| ගමන් දීමනා | - | 400 (01) | 400 |
| ප්‍රසාද දීමනා | - | - | 500 (01) |
| සමාගමේ දායකත්වයන් : | | | |
| EPF (15%) | 750 | 675 (01) | 1 500 |
| ETF (3%) | 150 | 135 (01) | 300 |
| | 8 400 | 6 460 | 15 950 |
| | (ලකුණු 02) | (ලකුණු 05) | (ලකුණු 03) |

(1) තීරුව: අයිතම 2කට 01 බැගින් ලකුණු (02)

(3) තීරුව: ඉතිරි අයිතම තුනකට 01 බැගින් ලකුණු 02 යි

(ආ) (1) පොදු ජ'නලය

රු'000

| | හර | බැර | |
|---|---|---|---|
| ණයගැති පාලන ගිණුම<br>ලාභාලාභ ගිණුම/විකුණුම් ගිණුම<br>(විකුණුම් ජ'නලයේ එකතුව වූ රු. 3 000 000ක්, රු. 300 000ක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම) | 2 700 | 2 700 | (02) |
| අවිනිශ්චිත ගිණුම<br>ණයගැති පාලන ගිණුම<br>(දුන් වට්ටම්, ණයගැති පාලන ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීම) | 500 | 500 | (02) |
| ණයහිමි පාලන ගිණුම<br>ලාභාලාභ ගිණුම/ගැණුම් ගිණුම<br>(ගැණුම් ජ'නලයේ එකතුව වූ රු. 2 400 000ක්, රු. 4 200 000ක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම) | 1 800 | 1 800 | (02) |
| ලාභාලාභ ගිණුම/විකුණුම් ගිණුම<br>ලාභාලාභ ගිණුම/ආපසු යැවුම් ගිණුම<br>(ආපසු යැවුම්, විකුණුම් ගිණුමේ සටහන්වීමේ වරද නිවැරදි කිරීම) | 20 | 20 | (02) |

**(ලකුණු 08)**

(2) සංශෝධිත ලාභය රු: 2 500 000 (05)

| | | |
|---|---|---|
| **පෙරවැඩ :** | | රු'000 |
| කෙටුම්පත් අලාභය | | (2 000) |
| එකතුකලා : | | |
| විකුණුම් අඩුවෙන් සටහන් වීම | 2 700 (02) | |
| ගැනුම් වැඩියෙන් සටහන් වීම | 1 800 (02) | 4 500 |
| සංශෝධිත ලාභය | | 2 500 |

**(ලකුණු 05)**

(3) ණයගැති පාලන ගිණුම රු'000

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 300 (01) | මුදල් | 1 250 (01) |
| දුන් වට්ටම් | 250 (01) | | |
| ශේෂය ප/ගෙ | 700 | | |
| | 1 250 | | 1 250 |
| | | ශේෂය ඉ/ගෙ | 700 |

**(ලකුණු 03)**

(4) ණයහිමි පාලන ගිණුම රු'000

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 180 (01) | ගැනුම් | 2 400 (01) |
| ලද වට්ටම් | 200 (01) | | |
| ආපසු යැවුම් | 20 (01) | | |
| ශේෂය ප/ගෙ | 1 000 | | |
| | 2 400 | | 2 400 |
| | | ශේෂය ඉ/ගෙ | 1 000 |

**විකල්පය :** ණයහිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 180 [01] | ගැනුම් | 4 200 |
| ලද වට්ටම් | 200 [01] | | |
| ආපසු යැවුම් | 20 [01] | | |
| ශේෂය ප/ගෙ | 2 800 | | |
| | 4 200 | | 4 200 |
| ගැනුම් | 1 800 (01) | ශේෂය ඉ/ගෙ | 2 800 (03) |
| ශේෂය ප/ගෙ | 1 000 | | |
| | 2 800 | | 2 800 |
| | | ශේෂය ඉ/ගෙ | 1 000 |

**(ලකුණු 04)**
**(මුළු ලකුණු 30)**

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30 කි.
4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 74%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 08%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 8%ක් පමණ වන අතර අයදුම්කරුවන්ගෙන් 31%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.

ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව




4 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3ක පහසුතාව 50%ට වඩා ඉහළ ය. පහසුතාව අවම අනුකොටස (අ) (2) වන අතර එහි පහසුතාව 24%ක් වේ. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (3) වන අතර එහි පහසුතාව 59% වේ.

(4) (අ) (1) කොටසේ පහසුතාව 30%කි. සෘජු වේතන පැහැදිලිව හඳුනා ගැනීමට බොහෝ සිසුන්ට අපහසු වී තිබුණි. (අ) (2) කොටසේ පහසුතාව 24%කි. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයෙහි අන්තර්ගත වියදම පැහැදිලි ව හඳුනා ගැනීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි. (අ) (3) කොටසේ පහසුතාව 40%කි. සේවක මුළු වියදම ද බොහෝ සිසුන් නිවැරදි ව ගණනය කර නොතිබුණි.

(4) (ආ) (1) කොටසේ පහසුතාව 54%කි. උප ලෙජර් පවත්වා ගෙන යන අවස්ථාවකදී පාලන ගිණුම් ඇසුරින් වැරදි නිවැරදි කිරීමේ අවබෝධය අඩුබවක් දක්නට ලැබුණි. සිසුන් බොහෝ පිරිසක් සංලක්ෂය ලිවීම පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(4) (ආ) (2) කොටසේ පහසුතාව 42%කි. කෙටුම්පත් අලාභයට විකුණුම් හා ගැනුම්වල අඩුවැඩිවීම් ගැලපීම පිළිබඳ අවබෝධය අඩුය. (ආ) (3) කොටසේ පහසුතාව 59%කි. බොහෝ සිසුන් නිවැරදි කිරීමට පෙර පාලන ගිණුම වෙනුවට ණයගැති ලෙජරයේ සාරාංශ ගත තොරතුරු ඇසුරින් පාලන ගිණුම් පිළියෙල කර තිබුණි.

(ආ) (4) කොටසේ පහසුතාව 56%කි. බොහෝ සිසුන් ණයහිමි ලෙජරයේ සාරාංශ ගත තොරතුරු ඇසුරින් ණයහිමි පාලන ගිණුම සකස් කර තිබූ අතර, පාලන ගිණුම් සම්බන්ධ වැරදි නිවැරදි කිරීම් පිළිබඳ අවබෝධය බොහෝ සිසුන්ට අඩුබවක් පෙනුණි.

05 ප්‍රශ්නය

**5. (අ)** පහත තොරතුරු 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමුද්‍රා පොදු සමාගම සතු වූ යන්ත්‍රවලට අදාළ වේ.

| යන්ත්‍ර අංකය | මිල දී ගත් දිනය | පිරිවැය (රු. '000) | සුන්බුන් අගය (රු. '000) | ඵලදායී ජීව කාලය (වසර) |
|---|---|---|---|---|
| 1 | 2010.10.01 | 800 | 200 | 5 |
| 2 | 2011.04.01 | 1 600 | 100 | 6 |
| 3 | 2013.07.01 | 1 400 | 200 | 6 |
| | | **3 800** | | |

**අතිරේක තොරතුරු:**

(i) සියලු යන්ත්‍ර මිල දී ගත් දිනයේ සිට භාවිත කළ හැකි අතර ඒවා පිරිවැය මත වාර්ෂික ව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(ii) 2013.10.01 දින යන්ත්‍ර අංක 1 රු. 550 000 කට විකුණන ලදී.

(iii) 2013.04.01 දින යන්ත්‍ර අංක 2 හි ඵලදායී ජීව කාලය වසර 6 සිට 10 ක් දක්වා සංශෝධනය කරන ලදී. නමුත් එහි සුන්බුන් අගය වෙනස් නොවී ය.

**අවශ්‍යවන්නේ:**

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත ගිණුම්:

(1) යන්ත්‍ර

(2) යන්ත්‍ර සමුච්චිත ක්ෂය

(3) යන්ත්‍ර ඉවත් කිරීම

**(ආ)** දින 10 ක් පුරා පැවැත්වීමට නියමිත වෙළෙඳ ප්‍රදර්ශනයක දී නව භාණ්ඩයක් හඳුන්වා දීමට සහ විකිණීමට සමාගමක් භාර ගෙන ඇත. මෙම භාණ්ඩය එහි සැපයුම්කරු විසින් ඒකකයක් රු. 4 500 ක පිරිවැයකට සමාගමට සපයනු ලබයි. මෙම භාණ්ඩ ඒකකයක් රු. 8 000 ක මිලකට විකිණීමට අපේක්ෂා කළත්, මෙම මිලෙන් 20% ක වට්ටමක් ප්‍රදර්ශනයේ දී දෙනු ලැබේ. අපේක්ෂිත පිරිවැය පහත පරිදි වේ.

| විස්තරය | රු. |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා කුලිය ........ | 40 000 |
| අත්පත්‍රිකා මුද්‍රණය කිරීමේ පිරිවැය ........ | 5 000 |
| ප්‍රදර්ශන කුටියේ කළමනාකරුට දීමනාව ........ | 25 000 |
| විකුණුම් සහකරුවකු සඳහා දීමනා (එක් දිනකට)........ | 1 000 |
| විකුණන සෑම භාණ්ඩ ඒකකයක් සමඟ ම තෑගි කරන කෝප්පයේ මිල ........ | 100 |

විකුණුම් සහකරුවන් දෙදෙනකු මෙම කාල සීමාව සඳහා බඳවා ගනු ලැබේ.

**අවශ්‍යවන්නේ:**

(1) මෙම කාර්යයේ මුළු ස්ථාවර පිරිවැය
(2) මෙම කාර්යයේ මුළු පිරිවැය ආවරණය කිරීමට විකිණිය යුතු ඒකක ගණන
(3) රු. 270 000 ක ලාභයක් ඉපයීම සඳහා විකිණිය යුතු ඒකක ගණන
(4) විකුණන සෑම ඒකකයක් සඳහා ම විකුණුම් මිල මත 10% ක කොමිස් මුදලක් කළමනාකරුට ගෙවනු ලබන විට විකුණුම් ඒකක 100 ක දී උපයන ලාභය (කළමනාකරුට ගෙවන දීමනාවට අමතර ව)

## පිළිතුර

**ප්‍රශ්න අංක 05**

(අ) (1) යන්ත්‍ර ගිණුම (රු'000)

| | | | | | |
|---|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 2 400 | (01) | යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම | 800 | (01) |
| මුදල් | 1 400 | (01) | ශේෂය ප/ගෙ | 3 000 | |
| | 3 800 | | | 3 800 | |
| ශේෂය ඉ/ගෙ | 3 000 | | | | |

**(ලකුණු 03)**

(2) යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම (රු'000)

| | | | | | |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම | 360 | (01) | ශේෂය ඉ/ගෙ | 800 | (01) |
| | | | යන්ත්‍ර ක්ෂය ගිණුම | 335 | (02) |
| ශේෂය ප/ගෙ | 775 | | | | |
| | 1 135 | | | 1 135 | |
| | | | ශේෂය ඉ/ගෙ | 775 | |

**(ලකුණු 04)**

(3) යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම (01) (රු'000)

| | | | | | |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර ගිණුම | | 800 | යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම | 360 | |
| ලාභාලාභ ගිණුම | (01) | 110 | මුදල් | 550 | (01) |
| | | 910 | | 910 | |

**(ලකුණු 03)**

**පෙර වැඩ :**

වාර්ෂික යන්ත්‍ර ක්ෂය (රු'000)

| | | | |
|---|---|---|---|
| යන්ත්‍ර 1 - 120 x 1/2 | = | 60 | |
| යන්ත්‍ර 2 - $\frac{1600 - 100 - 500}{8}$ | = | 125 (01) | (01) |
| යන්ත්‍ර 3 - $\frac{1400 - 200}{6}$ x 3/4 | = | 150 | |
| | = | 335 | |

(ආ) (1) ස්ථාවර පිරිවැය රු. 90 000 (05)

**පෙර වැඩ :**

| | | රු | |
|---|---|---|---|
| ප්‍රදර්ශන කුටියේ කුලිය | = | 40 000 | (01) |
| අත්පත්‍රිකා මුද්‍රණ පිරිවැය | = | 5 000 | (01) |
| කළමනාකරුගේ දීමනාව | = | 25 000 | (01) |
| විකුණුම් සහකරුගේ දීමනාව | = | 20 000 | (02) |
| | | 90 000 | |

**(ලකුණු 05)**

(2) ඒකක 50 (05)

**පෙර වැඩ :**

$$\frac{(01)\ 90\ 000}{1\ 800\ (04)}$$

(6 400 - 4 500 - 100)

[02] [01] [01]

**(ලකුණු 05)**

(3) ඒකක 200 (04)

**පෙර වැඩ :**

$$\frac{(01)\ 90\ 000 + 270\ 000\ (01)}{(01)\ 1\ 800}$$

**(ලකුණු 04)**

(4) ලාභය රු. 26 000 (06)

**පෙර වැඩ :**

100 (01) x 1 160 (03) - (01) 90 000

6 400 - (4 500 + 100 + 640)

[01] [01] [01]

**(ලකුණු 06)**

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.

5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 72%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 11%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 11%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් ලකුණු 07 හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය 38%කි.




මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 7න් කොටස් 4ක පහසුතාව 50% වඩා ඉහළය. ඉහළම පහසුතාව (ආ) (1) 69%කි. අඩුම පහසුතාවය (අ) (2) 29%ක් ද, (ආ) (4)හි 24%ක් ද වේ.

(5) (අ) (1) පහසුතාව 56%කි. යන්ත්‍ර ගිණුමේ ආරම්භක ශේෂය රු 2400000 වෙනුවට රු 3800000 යොදා ගෙන තිබූ අතර, ඉවත් කරන යන්ත්‍රයේ පිරිවැය ද නිවැරදි ව යන්ත්‍ර ගිණුමට බැර කර නොතිබුණි.

(5) (අ) (2) පහසුතාව 29%කි. ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ආරම්භක ශේෂය හා වාර්ෂික ක්ෂය ප්‍රමාණය ද, ඉවත් කරන යන්ත්‍රයට අදාළ සමුච්චිත ක්ෂය ප්‍රමාණය නිවැරදි ව ගණනය කිරීම පිළිබඳ අවබෝධයක් නොතිබුණි.

(5) (අ) (3) පහසුතාව 61%කි. යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම් පිළියෙල කිරීමේදී ඉවත්කරන ලද යන්ත්‍රයට අදාළ සමුච්චිත ක්ෂය නිවැරදි ව ගණනය නොකිරීම නිසා ඊට අදාළ ලකුණු බොහෝ සිසුන්ට අහිමි වී තිබුණි.

ක්ෂය ගණනය කිරීම හා ඉවත් කිරීම සම්බන්ධ අවබෝධයක් ඇතිවන ආකාරයටත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

(5) (ආ) (3) කොටස් සඳහා පහසුතාව 54%ට වඩා වැඩිය. (2) (4) කොටස් සඳහා පහසුතාව 44% හා 24% කි. බොහෝ සිසුනට දායකය ගණනය කිරීම පිළිබඳ අවබෝධයක් නොතිබුණි.

ආන්තික පිරිවැයකරණය සම්බන්ධ සංකල්ප හා ගණනය කිරීම් පිළිබඳ මනා අවබෝධයක් ඇති වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

## 06 ප්‍රශ්නය

**6.** සීමිත සත්සර පොදු සමාගම 2013.04.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි පළමු මෙහෙයුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

**2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශගත විස්තිරණ ආදායම් ප්‍රකාශනය**

| | රු.'000 |
|---|---|
| විකුණුම් | 6 250 |
| විකුණුම් පිරිවැය | (2 850) |
| දළ ලාභය | 3 400 |
| වියදම් | (2 500) |
| බදු පෙර ලාභය | 900 |
| වර්ෂය සඳහා ආදායම් බදු | (300) |
| **වර්ෂය සඳහා ලාභය** | **600** |
| **වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම** | **600** |

### 2014.03.31 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකමට | 6 000 |
| තොගය | 1 500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (වෙළෙඳ ණයගැතියෝ) | 4 000 |
| බැංකුවේ ඇති මුදල් | 1 000 |
| | **12 500** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටසක් රු. 70 බැගින් කොටස් 100 000) | 7 000 |
| රඳවාගත් ඉපැයුම් | 500 |
| 12% බැංකු ණය (2013.04.01 දින වසර 5 ක් සඳහා ලබාගත්) | 2 500 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (වෙළෙඳ ණයහිමියෝ) | 2 150 |
| ගෙවිය යුතු බදු | 200 |
| ගෙවිය යුතු පොලී | 150 |
| | **12 500** |

**අතිරේක තොරතුරු:**

(i) සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදු විය.

(ii) දේපළ, පිරියත සහ උපකරණ මුදලට මිල දී ගෙන පහත පරිදි ක්ෂය කර ඇත. මෙම ක්ෂය, වියදම් තුළ අන්තර්ගත වේ.

| වත්කම | වර්ෂය සඳහා ක්ෂය (රු.'000) | 2014.03.31 දිනට ධාරණ වටිනාකම (රු.'000) |
|---|---|---|
| මෝටර් රථ | 400 | 3 600 |
| කාර්යාල උපකරණ | 600 | 2 400 |
| | **1 000** | **6 000** |

(iii) වියදම් තුළ බැංකු ණය සඳහා පොලිය ද අන්තර්ගත වේ. නමුත් මෙම පොලියෙන් අඩක් පමණක් වසර තුළ දී ගෙවා ඇත.

(iv) වර්ෂය තුළ දී සමාගම විසින් අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) පහත දෑ ගණනය කිරීම:
- (i) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය
- (ii) පොලී ආවරණ අනුපාතය
- (iii) ජංගම අනුපාතය
- (iv) ණය අනුපාතය
- (v) වත්කම් පිරිවැටුම් අනුපාතය (වර්ෂය අග මුළු වත්කම් මත)

(2) LKAS 7 ට (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) අනුව 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සත්සර පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## පිළිතුර

## ප්‍රශ්න අංක 06

(1) (i) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය = 8%

පෙර වැඩ :

$$\frac{\text{වර්ෂය සඳහා ලාභය}}{\text{හිමිකම}} \times 100 = \frac{600 \;(01)}{7\,500 \;(01)} \times 100$$

(ii) පොලී ආවරණ අනුපාතය = වාර 04

පෙර වැඩ :

$$\frac{\text{බදු පෙර ලාභය + පොලිය}}{\text{පොලිය}} = \frac{900 + 300}{300}$$ (01) (01)

(iii) ජංගම අනුපාතය = 2.6 : 1

පෙර වැඩ :

$$\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}} = \frac{6\ 500}{2\ 500}$$ (01) (01)

(iv) ණය අනුපාතය = 25%

පෙර වැඩ :

$$\frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{මුළු ප්‍රාග්ධනය}} \times 100 = \frac{2\ 500}{10\ 000} \times 100$$ (01) (01)

(v) වත්කම් පිරිවැටුම් අනුපාතය = වාර 0.5

පෙර වැඩ :

$$\frac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}} = \frac{6\ 250}{12\ 500}$$ (01) (01)

**(ලකුණු 10)**

(2) වක්‍ර ක්‍රමය

**සීමිත සත්සර පොදු සමාගම**
**2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** (01)

(රු.000)

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ | | |
| බදු පෙර ලාභය | 900 (01) | |
| ක්ෂය | 1 000 (01) | |
| පොලී වියදම | 300 (01) | |
| | 2 200 | |
| තොග වැඩිවීම | (1 500) (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ වැඩිවීම | (4 000) (01) | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ වැඩිවීම | 2 150 (01) | |
| මෙහෙයුම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | (1 150) | |
| පොලී ගෙවීම් | (150) (01) | |
| ආදායම් බදු ගෙවීම් | (100) (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01) | | (1 400) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම (4 000+3 000) | (7 000) (02) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් 01 01 (01) | | (7 000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල | 7 000 (01) | |
| බැංකු ණය ලබාගැනීම | 2 500 (01) | |
| ලාභාංශ ගෙවීම | (100) (02) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් (01) | | 9 400 |
| මුදල් හා මුදල් සමාන දෑ වන ශුද්ධ වැඩිවීම | | 1 000 (01) |
| 2013.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ (01) | | - |
| 2014.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 1 000 |

සෘජු ක්‍රමය

සීමිත සත්සර පොදු සමාගම
2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (01)

(රු.000)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| ගනුදෙනුකරුවන්ගේ ලද මුදල් (6 250 - 4 000) [01] [01] | 2 250 (02) | |
| සැපයුම්කරුවන් හා සේවකයින්ට ගෙවූ මුදල් | (3 400) (04) | |
| 1 200 (2 500 - 300 - 1 000) + 2 200 (4 350 - 2 150) [01] [01] [01] [01] | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් | (1 150) | |
| ගෙවූ පොලිය | (150) (01) | |
| ගෙවූ බදු | (100) (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01) | | (1 400) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම (4 000+3 000) [01] [01] | (7 000) (02) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01) | | (7 000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල | 7 000 (01) | |
| බැංකු ණය ලබාගැනීම | 2 500 (01) | |
| ලාභාංශ ගෙවීම | (100) (02) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් (01) | | 9 400 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | | 1 000 (01) |
| 2013.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ (01) | | - |
| 2014.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 1 000 |

**(ලකුණු 20)**

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 63%ක් පමණි.

ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 24%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 24%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 25%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 06කි. ඉන් වැඩිම පහසුතාවක් ඇත්තේ (1) iii කොටසට වන අතර එය 76%කි. පහසුතාව අඩුම කොටස (1) (iv) වන අතර එහි පහසුතාව 48%කි.

(6) (1) (iv) කොටසෙහි පහසුතාව 48%කි. ණය අනුපාතය නිවැරදි ව ගණනය කිරීමට බොහෝ සිසුනට නොහැකි වී තිබුණි. මුළු ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය පිළිබඳ අවබෝධය ලැබෙන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

(6) (2) කොටසෙහි පහසුතාව 50%කි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීම පිළිබඳ ව සිසුන්ගේ අවබෝධය අඩු බැවින් මෙම අවබෝධය ලැබෙන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

## 07 ප්‍රශ්නය

7. (අ) සමාගමක් නව භාණ්ඩයක් නිපදවීමට සැලසුම් කරමින් සිටී. මේ සඳහා වසර 4 ක ඵලදායී ජීව කාලයක් සහිත නව යන්ත්‍රයක් රු. 2 000 000 කට මිල දී ගත හැක. වසර 4 කට පසු යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 200 000 කි. භාණ්ඩයේ අපේක්ෂිත ඉල්ලුම පහත පරිදි වේ:

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ඉල්ලුම (ඒකක) | 4 000 | 5 200 | 6000 | 6 000 |

භාණ්ඩයේ අපේක්ෂිත විකුණුම් මිල ඒකකයක් සඳහා රු. 800 ක් වන අතර එහි ඒකකයක විචල්‍ය පිරිවැය රු. 500 කි. නව යන්ත්‍රයේ ක්ෂය හැර ස්ථාවර නිෂ්පාදන පිරිවැය පළමු වර්ෂයේ දී රු. 300 000 ක් වන අතර එය ඉන් පසුව වාර්ෂික ව රු. 60 000 බැගින් වැඩි වේ යැ'යි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත ආයෝජන ප්‍රතිලාභ අනුපාතය 10% ක් වේ.

10% ක අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක (පළමු දශමස්ථානයට):

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 | 0.6 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය සහ ශුද්ධ වර්තමාන අගය

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය පදනම් ව යන්ත්‍රය මිල දී ගත යුතු ද යන තීරණය හේතුව සහිත ව

**( ලකුණු 05 යි)**

(ආ) අවට ප්‍රදේශයේ තරුණයන් ස්වයං රැකියා සඳහා පුහුණු කිරීමට වෘත්තීය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයක් 2013.04.01 දින පාසලක පිහිටුවන ලදී. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

(i) ඇතුළත් වීමේ ගාස්තු සහ සාමාජික මුදල්:

- මෙම මධ්‍යස්ථානය සාමාජිකයන් 50 කින් ආරම්භ කරන ලදී.
- සෑම සාමාජිකයකු ම රු. 500 ක ඇතුළත් වීමේ ගාස්තුවක් ගෙවා ඇත.
- සාමාජිකයකුගේ මාසික සාමාජික මුදල රු. 500 ක් වේ.
- සාමාජිකයන් 40 දෙනෙකු වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා ඇති අතර, ඉතිරි 10 දෙනා සාමාජික මුදල් ගෙවා ඇත්තේ මාස 9 ක් සඳහා පමණි.

(ii) පාඨමාලාව පවත්වාගෙන යාම:

- පළමු වැඩසටහන ලෙස වසරක මෝටර් කාර්මික පාඨමාලාවක් 2013.06.01 දින හඳුන්වා දෙන ලදී.
- මාසයක් සඳහා ශිෂ්‍යයකුගේ පාඨමාලා ගාස්තුව රු. 1 000 කි. පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් 25 දෙනෙකු ලියාපදිංචි විය. ඔවුන්ගෙන් 20 දෙනෙකු මුළු පාඨමාලා ගාස්තුව ගෙවන ලද අතර ඉතිරි අය ගෙවා ඇත්තේ මාස 6 කට පමණි.
- මෙම පාඨමාලාව පාසල තුළ ම පවත්වාගෙන යනු ලබන අතර එහි පහසුකම් භාවිත කිරීම වෙනුවෙන් රු. 2 000 ක මාසික ගෙවීමක් කරන ලදී.
- පාඨමාලා උපදේශක විසින් ගාස්තුවක් අය නොකළ නමුත් ඔහුට මසකට රු. 3 000 ක් බැගින් වූ ගමන් ගාස්තුවක් ගෙවන ලදී.

(iii) මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම:

- 2013.04.01 දින වසර 4 ක ඵලදායී ජීව කාලයක් සහිත රු. 360 000 ක් වටිනා ත්‍රී රෝද රථයක් පරිත්‍යාගයක් ලෙස ලැබුණි. මෙම දිනයේ සිට එය භාවිතයට ගත් අතර එය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.
- ප්‍රවර්තන වර්ෂයේ සිට ආරම්භ වී වසර 4 ක කාලයක් තුළ මෙම පරිත්‍යාගය සමාන ව ආදායම තුළ හඳුනාගනී.
- මධ්‍යස්ථානයේ කළමනාකරුට 2013.04.01 දින සිට රු. 10 000 බැගින් වූ මාසික දීමනාවක් ගෙවනු ලබන අතර එය ඊළඟ මාසයේ 10 වැනි දින ගෙවිය යුතු වේ.
- වර්ෂය තුළ දී පිළිවෙළින් රු. 60 000 ක් සහ රු. 20 000 ක්, ලිපිද්‍රව්‍ය සහ ත්‍රී රෝද රථ ධාවන වියදම් සඳහා ගෙවා ඇත. වර්ෂය තුළ දී රු. 40 000 ක් වූ ලිපිද්‍රව්‍ය පමණක් භාවිත කර ඇත.

**අවශ්‍යවන්නේ:**

වෘත්තීය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය සඳහා පහත දෑ:

(1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම

(2) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

(3) 2014.03.31 දිනට සමුච්චිත අරමුදල

## පිළිතුර
**ප්‍රශ්න අංක 07**

(අ) (1) පිළිගෙවුම් කාලය = <u>වර්ෂ 01 මාස 11</u> (02)

**පෙර වැඩ :**

| වර්ෂය | ශුද්ධ මුදල් ප්‍රවාහය | සමුච්චිත ශුද්ධ මුදල් ප්‍රවාහය |
|---|---|---|
| 0 | (රු 000) | (2 000) |
| 1 | (2 000) | (1 100) |
| 2 | 900 | 100 |
| 3 | 1 200 | |
| 4 | 1 380 | |
| | 1 520 | |

$$\text{වර්ෂ } 01 + \frac{1\ 100}{1\ 200} \times \text{ මාස } 12$$ (01)

ශුද්ධ වර්තමාන අගය = <u>රු 1 648 000</u> (06)

**පෙර වැඩ :**

(රු.000)

| වර්ෂය | $Y_0$ | $Y_1$ | $Y_2$ | $Y_3$ | $Y_4$ |
|---|---|---|---|---|---|
| මූලික ආයෝජනය | (2 000) | - | - | - | - |
| සුන්බුන් අගය | - | - | - | - | 200 |
| විකුණුම් | - | 3 200 | 4 160 | 4 800 | 4 800 |
| විචල්‍ය පිරිවැය | - | (2 000) | (2 600) | (3 000) | (3 000) |
| ස්ථාවර නිෂ්පාදන පිරිවැය | - | (300) | (360) | (420) | (480) |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (2 000) | 900 | 1 200 | 1 380 | 1 520 |
| 10% වට්ටම් සාධකය | 1.00 | 0.9 | 0.8 | 0.7 | 0.6 |
| වර්තමාන අගය | (2 000) (01) | 810 (01) | 960 (01) | 966 (01) | 912 (02) |

} අයිතම තුනකට එක බැගින් උපරිම (05) යි.

**(ලකුණු 08)**

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය **ධන** අගයක් ගන්නා බැවින් යන්ත්‍රය මිලදී ගැනීම **යෝග්‍ය** වේ. (02)

**(ලකුණු 02)**

## පිළිතුර

(ආ) (1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| | රු | | රු | |
|---|---|---|---|---|
| ඇතුළත් වීමේ ගාස්තු | 25 000 (01) | පහසුකම් ගාස්තු | 20 000 | (01) |
| සාමාජික මුදල් | 285 000 (02) | උපදේශකගේ ගමන් ගාස්තු | 30 000 | (01) |
| පාඨමාලා ගාස්තු | 270 000 (02) | කළමනාකරුගේ දීමනාව | 110 000 | (01) |
| | | ලිපිද්‍රව්‍ය | 60 000 | (01) |
| | | ත්‍රීරෝද රථ ධාවන වියදම් | 20 000 | |
| | | ශේෂය ප/ගෙ | 340 000 | |
| | 580 000 | | 580 000 | |

**(ලකුණු 09)**

(2) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

| | රු | |
|---|---|---|
| **ආදායම්** | | |
| ඇතුළත් වීමේ ගාස්තු | 25 000 | |
| සාමාජික මුදල් | 300 000 | (01) |
| පාඨමාලා ගාස්තු | 250 000 | (01) |
| ත්‍රීරෝද රථ පරිත්‍යාගය | 90 000 | (01) |
| | 665 000 | |
| **වියදම්** | | |
| පහසුකම් ගාස්තු | (20 000) | |
| උපදේශකගේ ගමන් ගාස්තු | (30 000) | |
| ත්‍රීරෝද රථ ක්ෂය | (90 000) | (01) |
| කළමනාකරුගේ දීමනාව | (120 000) | (01) |
| ලිපිද්‍රව්‍ය | (40 000) | (01) |
| ත්‍රීරෝද රථ ධාවන වියදම් | (20 000) | |
| අතිරික්තය (01) | 345 000 | |

(ඉතිරි අයිතම 2කට 1 බැගින් ලකුණු (02))
**(ලකුණු 09)**

(3) 2014.03.31 දිනට සමුච්චිත අරමුදල : රු. 345

**(ලකුණු 02)**

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 53%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 17%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 10%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව**




**7 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්**

මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් 5ක් අතුරින් කොටස් (අ) (2) කොටසෙහි පමණක් පහසුතාවය 55%ට වැඩිය. ඉතිරි සෑම කොටසකම පහසුතාව 33%ට වඩා අඩුය.

(7) (අ) (1) කොටසෙහි පහසුතාව 32%කි.
(අ) (2) කොටසෙහි පහසුතාව 55%කි.

එක් එක් වර්ෂයේ මුදල් ගලා ඒම් සහ මුදල් ගලායෑම් නිවැරදි ව ගණනය කිරීමට නොහැකි වූ බැවින් බොහෝ සිසුන්ට ශුද්ධ මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට නොහැකි විය. එබැවින් නිවැරදි ව පිළිගෙවුම් කාලය හා ශුද්ධ වර්තමාන අගය ගණනය කළ නොහැකි විය.

(7) (ආ) (1) (2) (3) කොටස්වල පහසුතාවය 33%ට වඩා අඩුය.

ලැබීම් හා ගෙවීම් නිවැරදි ව ගණනය කිරීම පිළිබඳ අවබෝධ කරගෙන නොතිබුණි. සාමාජිකයන්ගෙන් මුදලින් ලද ආදායම, පාඨමාලා ගාස්තු හා මුදලින් ගෙවූ කළමනාකරුගේ දීමනාව, උපදේශක ගමන් ගාස්තු නිවැරදි ව ගණනය කර නොතිබීම හේතුවෙන් මෙම කොටසෙහි පහසුතාවය අඩු වී ඇත. ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීමේදී පහත අයිතමයන් නිවැරදි ව හඳුනා ගෙන නොතිබුණි. පාඨමාලා ගාස්තු, ත්‍රී රෝද රථ පරිත්‍යාග සහ සාමාජික මුදල් ආදායම් ද, උපදේශකගේ ගමන් ගාස්තු, කළමනාකරුගේ දීමනාව. ලාභ අරමුණු කර නොගත් සංවිධානවල පවතින බාහිර ක්‍රියාකාරකම් නිදසුන් ලෙස යොදා ගනිමින් වර්ෂය තුළ දී ලැබූ මුදල් ප්‍රමාණයන්, වර්ෂයට අදාළ ආදායම් ප්‍රමාණයන් පැහැදිලි වනසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




II ප්‍රශ්න පත්‍රයේ 7 වන ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්නවල පහසුතාව 39% හෝ ඊට වැඩිය.

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අතරින් 55%ක වැඩිම පහසුතාවක් දැකිය හැක්කේ 2 වන ප්‍රශ්නයට වන අතර 34%ක අඩුම පහසුතාවක් දැකිය හැක්කේ 7 වන ප්‍රශ්නයටය.

පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. මෙම ප්‍රශ්න දෙක අතුරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 2 වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 55%කි.

ප්‍රශ්න අංක 3, 4, 5, 6 සහ 7 යන ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 4ක් අයදුම්කරුවන් විසින් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වන අතර, ඉන් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ 3 සහ 6 වන ප්‍රශ්න වේ. ඒවායේ පහසුතාව 54%කි. ප්‍රශ්න තෝරා ගැනීමේදී වැඩිම පිරිසක් තෝරා ගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නය වේ. මෙහි ප්‍රතිශතය 93%කි. දෙවන ප්‍රශ්න පත්‍රයේ තෝරා ගන්නා ප්‍රශ්නවලින් අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 7 වන ප්‍රශ්නය වන අතර එය 34%කි. තෝරා ගන්නා ප්‍රශ්න අතුරින් දෙවනුව වැඩිම පිරිසක් තෝරා ගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නය වන අතර එහි තෝරා ගැනීම 74% වන අතර පහසුතාව 46%කි.

# III කොටස

## 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

## 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතුද? අනිවාර්ය ප්‍රශ්න තිබේද, ඒ සඳහා වෙන් කොට ඇති කාලය කොපමණ ද? වෙන් කොට ඇති ලකුණු ප්‍රමාණය කොපමණ ද යනාදියයි.
* ප්‍රශ්න හොඳින් කියවා අවබෝධ කරගෙන තෝරා ගත යුතු අතර, ප්‍රශ්න තෝරා ගැනීමේදී හා පිළිතුරු ලිවීමේදී එය ප්‍රයෝජනයට ගත යුතුය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් ලිවිය යුතුය.
* අයදුම්කරුගේ විභාග අංකය අදාළ සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
* I පත්‍රයේ 1-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් ආසන්න පිළිතුරු අතුරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගත යුතුය.
* I පත්‍රයේ 31-50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දීර්ඝ විස්තර ඇතුළත් නොකළ යුතුය.
* II වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
* උත්තර පත්‍රයට පිටු අමුණන්නේ නම් නිවැරදිව අංක කර නොගැලවෙන පරිදි ඇමිණිය යුතුය.
* ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදි ව ලිවිය යුතුය.
* ප්‍රශ්නයෙහි අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
* එක් එක් අනු කොටස් හොඳින් කියවා බලා එක් එක් අනු කොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතුය.
* පිළිතුරු සැපයීමේදී කාලය නිසි පරිදි කළමනාකරණය කරගත යුතුය. මෙහිදී ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය සමග කාලය කළමනාකරණය කරගත හැකිය.
* පිළිතුරු ලිවීමේදී රතු, දම් සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

**විශේෂ උපදෙස් :**

1. ප්‍රශ්නවලට අදාළ පිළිතුර පියවරෙන් පියවර ඉදිරිපත් කළ යුතුය.
2. සංඛ්‍යා රුපියල් දහස්වලින් ඉදිරිපත් කරන්නේ නම් එය සඳහන් කළ යුතුය. (එනම් රු'000 ලෙස)
3. එක් එක් ප්‍රශ්නයට අදාළ පෙර වැඩ ඒ ඒ පිළිතුර සමග ඉදිරිපත් කළ යුතුය.
4. ප්‍රශ්නයක අනුකොටස් ඇති විටෙක එම අනුකොටස් සියල්ල එක ලග තිබෙන ලෙස පිළිතුරු ඉදිරිපත් කළයුතු අතර උත්තර පත්‍රයෙහි තැනින් තැන විසුරුවා ලිවීම නොකළ යුතුය.
5. ඉලක්කම් සහ ධන සෘණ ලකුණු ද, සත්‍ය අසත්‍ය බවද අදාළ වේ, අදාළ නොවේ ආදිය ද පැහැදිලි ව ලිවිය යුතුය.
6. තමා ලද අගය භාවිත කරමින් සම්පූර්ණ පිළිතුර සැපයිය යුතුය. එනම් ලද එක් පිළිතුරක් වැරදි යැයි උපකල්පනය කොට ඉතිරි කොටස්වලට පිළිතුරු නොලියා සිටීමෙන් වැළකිය යුතුය.
7. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ සටහන් හා පෙරවැඩ අතර වෙනස වටහා ගෙන පිළිතුරු සැපයීමට වගබලා ගත යුතුය.

## 3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, උසස් පෙළට නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිත සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පළකර ඇති උ.පෙළ ගිණුම්කරණය සම්බන්ධ පොත් යනාදිය සියළුම සිසුන් මෙන්ම ගුරුභවතුන් ද පරිශීලනය කළයුතු අතර ඒ පිළිබඳ ව දැනුවත් වීම හා භාවිතය ද අත්‍යාවශ්‍යය.

* ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට සාර්ථකව පිළිතුරු ලිවීමට නම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රායෝගික ගැටළු මුල් කරගෙන සකස් කළ අභ්‍යාස ශිෂ්‍යයා ලවා කරවීම අවශ්‍යය.

* මුද්‍රණය කරන ලද අභ්‍යාස ලබාදීමට හැකියාවක් ඇත්නම් වැඩි අභ්‍යාස ප්‍රමාණයක් විසඳීමට සිසුන්ට අවස්ථාව ලැබෙනු ඇත.

* සාක්ෂරතාවයේ අඩුපාඩු හේතුවෙන් ප්‍රශ්න අවබෝධ කරගැනීමේ සහ ප්‍රකාශනය කිරීමේ ගැටළු අවම කර ගැනීම සඳහා සුදුසු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.

* ව්‍යාපාර ලෝකයේ ප්‍රායෝගිකව භාවිත කරන මූලාශ්‍ර ලියවිලි හා ගිණුම් වාර්තා පන්ති කාමර ආධාරක ලෙස භාවිත කරමින් විෂයය සංවර්ධනයට අවශ්‍ය අත්දැකීම් තහවුරු කර ගැනීමට මග පෙන්වීම අවශ්‍යය.

  නිදසුන් - මූලාශ්‍ර ලියවිලි
  - බැංකු ප්‍රකාශන
  - වැටුප් ලේඛන
  - තොග වාර්තා
  - සමාගම් වාර්ෂික වාර්තා

* මෙම විෂය ඉගෙන ගන්නාට මෙන්ම සමාජයටද එකසේ වැදගත් වන බැවින් අවබෝධයෙන් යුතුව, තර්කානුකූලව, මනසට රසවත් වන ආකාරයට ඉගෙන ගත යුතු අතර එක් එක් ඒකකය ඉගෙන ගත යුත්තේ මන්ද යන්න දරුවාගේ මනසට අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

* මෙම විෂය තීරණ ගැනීම සඳහා වැදගත් වන සමාජයීය විෂයයක් බැවින් ඉගෙනුම් උපකරණ හා මෙවලම් භාවිතය මගින් ප්‍රබෝධාත්මක ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමට හා කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබාදිය යුතුය.

* විෂය නිර්දේශයේ අවසාන විෂයය කොටස් පදනම් කරගෙන ඇතුළත් කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ ප්‍රවණතාවයේ අඩුවීමක් මෙන් ම එම කොටස් සඳහා ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාවේ අඩුවීමක් ද නිරීක්ෂණය වේ. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී එම විෂය කොටස් ආවරණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.

* නව විෂය දැනුම සංවර්ධනය කර ගැනීම හා යාවත්කාලීන වීමට විශේෂයෙන් ගුරු භවතුන් සැලකිලිමත් විය යුතු අතර, ශිෂ්‍යයින්ට ද එම කරුණ වැදගත් වේ. මෙමගින් කුසලතා පූර්ණ නිර්මාණශීලී පුද්ගලයන් බිහිවන අතර ඔවුන් මතු පරපුරට මහඟු දායාදයකි.